# ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රය

**අංක 11,637 — 1959 ජනවාරි 9 වැනි සිකුරාදා—9.1.1959**

(ආණ්ඩුවේ බලය පිට ප්‍රසිද්ධ කරන ලදී)


## I වැනි කොටස: (II) වැනි ජේදය—පළකිරීම්

**(එක් එක් කොටස වෙන වෙනම බැඳ තබා ගත හැකි වීම පිණිස පිටු අංක යොදා ඇත්තේ වෙන වෙනම එක් එක් කොටසට ගැලපෙන පරිද්දෙනි)**


| | පිට | | පිට |
|---|---|---|---|
| තනතුරු-ඇබෑර්තු ... ... | 59 | තොටුපල් රේන්ද හා වෙනත් රේන්ද විකිණීම | — |
| විභාග, විභාග ප්‍රතිඵල ආදිය ... | — | ආණ්ඩුවේ නොවන දැන්වීම ... ... | — |
| ටැන්ඩර් කැඳවීමේ දැන්වීම් ... | 61 | රට බීම විකිණීමේ බලපත්‍ර සඳහා වූ අයදුම් පත් | — |
| තීරණය කළ ටැන්ඩර් පත් පිළිබඳ දැන්වීම් | — | වෙන්දේසි කිරීම පිළිබඳ දැන්වීම් ... | — |
| බඩු බාහිරාදිය විකිණීම ... ... | — | විවිධ දැන්වීම ... ... | — |


## තනතුරු—ඇබෑර්තු

### ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රයෙහි පළ කෙරෙන රාජ්‍ය සේවා තනතුරුවලට කරන පත් කිරීම සම්බන්ධයෙන් අදාළ වන පොදු කොන්දේසි

**දීමනා.**—ගෙවල් කුලී දීමනාව, තාවකාලික ජීවන දීමනාව, තාවකාලික විශේෂ ජීවන දීමනාව යන මෙම දීමනා, ඒ සම්බන්ධයෙන් අන්‍යාකාරයෙන් සඳහන් කොට නැති අවස්ථාවන්හිදී, ආණ්ඩුවේ රෙගුලාසි අනුව ගෙවනු ලැබේ.

2. **සේවා කොන්දේසි.**—පත්වීම් වූ කලී රාජ්‍ය සේවා කොමිෂන් සභා ව්‍යවස්ථා, මුදල් රෙගුලාසි, කාර්‍ය සංවිධාන සංග්‍රහ රෙගුලාසි, දෙපාර්තමේන්තු විධාන හෝ රෙගුලාසි යන මේවාට සහ ආණ්ඩුවෙන් කලින් කල නිකුත් කෙරෙන සෙසු විධානවලට හෝ රෙගුලාසිවලට හෝ යටත් වන්නේ ය.

3. **සේවයට බාර ගැනීම පිළිබඳ කොන්දේසි.**—(i) විශ්‍රාම වැටුප් රහිත සංස්ථාවට කරන පත් කිරීම්වල දී (දවස් පඩි ලබන්නන් හැර) ඒ තනතුරුවලට පත්වන්නන්ට තම පඩියෙන් සියයට 5ක් රාජ්‍ය සේවා අර්ථසාධක අරමුදලට ගෙවීමට නියම කරනු ලැබේ. මීට අතිරේක වශයෙන් සවකීය මනාපය පරිදි තවත් සියයට 5ක් ද ඊට එක් කිරීමට ඔවුන්ට ඉඩ දෙනු ලැබේ. නිලධාරියා මේ දෙකෙන් කවරක් ගෙව්වත් එක් එක් මුදල් අවුරුද්ද අවසානයේ දී ඔහුට ගෙවා ඇති සම්පූර්ණ වැටුපෙන් සියයට 7½කට සමාන වන මුදලක් ඒ අරමුදලට සම්මාදම් වශයෙන් ආණ්ඩුවෙන් ද ගෙවනු ලැබේ.

(ii) ඒ ඒ තනතුරුවලට පත්වන්නන් විසින් "ඇප තැබීම කළ යුතුය"යි ඔවුන්ගේ දෙපාර්තමේන්තු ප්‍රධානයන් විසින් තීරණය කරනු ලැබුවහොත්, එවිට ආණ්ඩුවේ නිලධාරීන්ගේ (ඇප) ආඥාපනතට අනුකූල ව ඇප තබන ලෙස ඔවුන්ට නියම කෙරෙනු ඇත.

(iii) තනතුරුවලට පත්වන්නන් අතුරෙන් දැනටම රාජ්‍ය සේවාවෙහි සිටින්නන්ට හැර සෙස්සන්ට, ලංකාවේ කවර පෙදෙසක වුවත් සේවය කිරීමට ඔවුන් සුදුසුද, නැද්ද යනු පරීක්ෂා කිරීම සඳහා ආණ්ඩුවේ වෛද්‍ය නිලධාරියකු විසින් පැවැත්වෙන වෛද්‍ය පරීක්ෂණයකට පෙනී සිටීමට නියම කරනු ලැබේ.

4. **නවප්‍රවේශක නිලධාරීහු.**—(i) විශ්‍රාම වැටුප් සහිත/විශ්‍රාම වැටුප් රහිත තනතුරු වලට පත් කරනු ලබන "නවප්‍රවේශක නිලධාරීන්" සම්බන්ධයෙන්, කිසියම් තනතුරක් සඳහා වඩා දීර්ඝ කාලයක් නියම කොට ඇති අවස්ථාවන්හිදී මිස, අන් හැම අවස්ථාවකදීම ආධුනික/පරීක්ෂා කාලය යථායෝග්‍ය පරිදි තුන් වර්ෂයක් වේ.

(ii) "නවප්‍රවේශක නිලධාරීන්" ආණ්ඩුවේ භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාවේ යෙදවීමත් විශේෂයෙන්ම 1956 අංක 33 දරන රාජ්‍ය භාෂා පනතේ විධිවිධාන ක්‍රියාත්මක කිරීමත් සඳහා දැනට පනවා ඇති ව්‍යවස්ථාවලට මෙන් ම මින් මතු පනවනු ලබන ව්‍යවස්ථාවලට ද අනුකූල ව ක්‍රියා කළ යුතු වේ.

(iii) (අ) මෙම නිලධාරීන් සවකීය ආධුනික/පරීක්ෂා කාලය ඇතුළත සිංහල භාෂා විෂයෙහි ප්‍රවීණතාවක් ලබා ගත යුතු ය.

(ආ) සිංහල භාෂාව පිළිබඳ ප්‍රවීණතා පරීක්ෂණයකින් සමත් වීම, ආධුනික/පරීක්ෂා කාලය අවසන් වීමෙන් පසු එම නිලධාරීන්ගේ තනතුරු ස්ථිර කිරීම සඳහා අවශ්‍ය වන සුදුසුකම් අතුරින් එකක් වේ.

ආධුනික/පරීක්ෂා කාලය ඇතුළත සිංහල භාෂා විෂයෙහි ප්‍රවීණතාව සම්බන්ධයෙන් නියමිත වූ තත්ත්වයට එළඹීමට අසමත් වන අය තනතුරෙන් පහකරනු ලැබීමට ඉඩ තිබේ. එහෙත් "ඔවුන් රාජ්‍ය භාෂාව හැදෑරීමෙහි ලා අව්‍යාජ ප්‍රයත්නයක් දරා ඇත" යි ඔවුන් එම තනතුරුවලට පත් කළ බලධාරීන් විසින් පිළිගැනෙතොත්, එසේ තනතුරුවලින් පහ කිරීම ප්‍රමාද කිරීමට ඉඩ තිබේ. එබඳු වූ කිසියම් නිලධාරියකු නියමිත දිනයට පසු සැහෙන කාල සීමාවක් ඇතුළත සිංහල භාෂා ප්‍රවීණතාව සම්බන්ධයෙන් පැවැත්වෙන පරීක්ෂණයකින් සමත් වුවහොත්, කලින් අසමත් වීම නිසා ඔහුට නැති වී ගිය ජ්‍යෙෂ්ඨත්වය නැවත ලබා දීම, එම කාර්යය පිළිබඳ නිසි බලධාරීහුගේ කැමැත්ත පරිදි සිදු වේ.


59—ජේ. ඇන්. බී. 10672—6,397 (1/59)

8. අයදුම් කරුවන් තම අයදුම් පත් සමග ඉදිරිපත් කළයුතු පිටපත් :—

(අ) උප්පැන්න සහතිකය ;

(ආ) උපරිම අධ්‍යාපනික හා වෘත්තීය සුදුසුකම් පිළිබඳ සහතික ;

(ඉ) දක්ෂකම හා චරිතය පිළිබඳ ලබාගත් සහතික තුනක්.

**සැලකිය යුතුයි.**—මෙම සහතිකවල පිටපත් ආපසු එවනු නොලැබේ. සම්මුඛ පරීක්ෂණයට කැඳවූ විට මෙම සහතිකවල මුල් පිටපත් ඉදිරිපත් කළ යුතුයි.

9. මෙම නිවේදනයට අනුකූල නො වන අයදුම් පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

10. මෙම තනතුර සම්බන්ධව ඉදිරිපත් කරනු ලබන අයදුම් පත් හෝ වෙනයම් ලියවිලි හෝ වරාය කොමසාරිස්තුමා හැර මෙම දෙපාර්තමේන්තුවේ නිලධාරියෙකු ගේ පුද්ගලික ලිපිනයකට එවිය යුතු නැත. එසේ පුද්ගලික ලිපිනයට එවනු ලබන අයදුම් පත් ප්‍රතික්ෂේප වනු ඇත.

11. මෙම ගැසට් පත්‍රයේ I වැනි කොටසේ, (II) වැනි ඡේදයේ මුල සඳහන් වන රාජ්‍ය සේවයට බඳවා ගැනීමේ කොන්දේසිවලට අයදුම් කරුවන් ගේ සැලකිල්ල යොමු කරවනු ලැබේ.

12. අයදුම් පත් භාරගත් බවට පිළිතුරු සපයනු නො මැත.

ඊ. සී. ද අල්විස්,
වරාය කොමසාරිස්තුමා වෙනුවට.

වරාය කොමිෂන් සභා කාර්යාලය,
කොළඹ 1, 1958 දෙසැම්බර් 31 වෙනි දින.

### ආකෘති පත්‍රය

**සිවිල් ඉංජිනේරු ආධුනිකයන්ගේ තනතුරු—
වරාය කොමිෂන් සභාව**

1. සම්පූර්ණ නම :————.
2. ලිපිනය :————.
3. වයස හා උපන් දිනය :————.
4. අධ්‍යාපනික සුදුසුකම් :————.
   (1) සමත්වී තිබෙන පංතිය :————.
   විෂයයන් සඳහන් කරන්න :————.
   (2) සහතික පිටපත් ඉදිරිපත් කළ යුතුයි :————.
5. අවිවාහකද ? :————:
6. චරිත සහතික ඉදිරිපත් කරනු ලබන අයගේ නම් :————.
7. නිවේදනයේ 5 වැනි ඡේදයේ සඳහන් ඇප ඔප්පුවක් අත්සන් තැබීමට කැමතිද යන්න :————.
8. විශේෂ සුදුසුකම් හෝ වෙනයම් කරුණු ඇත් නම් :————.

ඉහත සඳහන් කරුණු සත්‍ය හා නිවැරදි බවට මෙයින් ප්‍රකාශ කරමි.

————,
අයදුම්කරුගේ අත්සන.

දිනම :————.

---

# ටැන්ඩර් කැඳවීමේ දැන්වීම්

## ආණ්ඩුවේ බඩු ගබඩා දෙපාර්තමේන්තුව

### මේස රෙදි සැපයීම

කොළඹ මහා භාණ්ඩාගාරයේ 270 වැනි කාමරයෙහි වූ මුදල් අමාත්‍යාංශයේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති තැන විසින් (තැපැල් ලිපිනය: තැ. පෙ. 500, කොළඹ 1) මේස රෙදි සැපයීම සඳහා 1959 පෙබරවාරි 10 වැනි අඟහරුවාදා පෙරවරු 9.30 තෙක් ටෙන්ඩර් පත්‍ර භාරගනු ලැබේ.

ටෙන්ඩර් පත්‍ර විවෘත කරන ඉහතකී වේලාවේදී ටෙන්ඩර්කරුවන්ට ඉදිරියේ සිටීමට ඉඩ දෙනු ලැබේ.

කොළඹ පාසන්ස් පාරේ ආණ්ඩුවේ බඩු ගබඩා දෙපාර්තමේන්තුවේ අධිකාරි තැන ගෙන් පෝරම කොළ ලබාගෙන ටෙන්ඩර් පත්‍ර ලියා අනු පිටපතක් ද සහිතව එවිය යුතුයි.

ටෙන්ඩර් තැන්පත් මුදලක් වශයෙන් රුපියල් 50ක් ආණ්ඩුවේ බඩු ගබඩාවෙහි කොළඹින් පිට ඕනෑම කච්චේරියක හෝ බැඳ ඒ බවට කුවිතාන්සියක් ඉදිරිපත් කළ විට 1959 පෙබරවාරි 9 වැනි සඳුදා දවල් 12 වන තෙක් ටෙන්ඩර් පෝර්ම කොළ දෙනු ලැබේ.

වැඩි විස්තර ආණ්ඩුවේ බඩු ගබඩා දෙපාර්තමේන්තුවෙන් ලබාගත හැක.

ලූ. ඒ. විජේසිංහ,
ගබඩා අධිකාරි.

1959 ජනවාරි 9 වැනි දින,
කොළඹදීය.

---

## ආණ්ඩුවේ බඩු ගබඩා දෙපාර්තමේන්තුව

### ලියුම් කවර සැපයීම

කොළඹ මහා භාණ්ඩාගාරයේ 270 වැනි කාමරයෙහි වූ මුදල් අමාත්‍යාංශයේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති තැන විසින් (තැපැල් ලිපිනය : තැ. පෙ. 500, කොළඹ 1) ලියුම් කවර සැපයීම සඳහා 1959 අප්‍රේල් මස 7 වැනි අඟහරුවාදා පෙරවරු 9.30 තෙක් ටෙන්ඩර් පත්‍ර භාරගනු ලැබේ.

ටෙන්ඩර් පත්‍ර විවෘත කරන ඉහතකී වේලාවේදී ටෙන්ඩර් කරුවන්ට ඉදිරියේ සිටීමට ඉඩ දෙනු ලැබේ.

කොළඹ පාසන්ස් පාරේ ආණ්ඩුවේ බඩු ගබඩා දෙපාර්තමේන්තුවේ අධිකාරි තැනගෙන් පෝරම කොළ ලබාගෙන ටෙන්ඩර් පත්‍ර ලියා අනු පිටපතක් ද සහිතව එවිය යුතුයි.

ආණ්ඩුවේ බඩු ගබඩාවෙහි හෝ කොළඹින් පිට ඕනෑම කච්චේරියක හෝ රුපියල් 100 ක ටෙන්ඩර් තැන්පත් මුදලක් බැඳ, ඒ බවට කුවිතාන්සියක් ඉදිරිපත් කළ විට 1959 අප්‍රේල් මස 6 වැනි සඳුදා දවල් 12 වන තෙක් ටෙන්ඩර් පෝර්ම කොළ දෙනු ලැබේ.

විදෙශීය ටෙන්ඩර් කරුවන් සඳහා විශේෂ ටෙන්ඩර් පෝර්ම සකස් කර තිබේ. රුපියල් 100 ක ටෙන්ඩර් තැන්පත් මුදලක් බැඳ ඒ බවට කුවිතාන්සියක් ඉදිරිපත් කළ විට බලය ලත් නියෝජිතයින්ට පමණක් එකී පෝර්ම කොළ දෙනු ලැබේ. ටෙන්ඩර් කරුවන් විසින් තමන්ට වුවමනා කවර අන්දමේ ටෙන්ඩර් පෝර්ම කොළ දැයි සඳහන් කළ යුතුයි.

වැඩි විස්තර ආණ්ඩුවේ බඩු ගබඩා දෙපාර්තමේන්තුවෙන් ලබා ගත හැක.

ලූ. ඒ. විජේසිංහ,
ගබඩා අධිකාරි.

1959 ජනවාරි මස 9 වැනි දින,
කොළඹ දීය.

---

## කෘෂිකර්ම දෙපාර්තමේන්තුව

### ගොවිපළවලට සත්ව ආහාර සැපයීම

පේරාදෙණියේ කෘෂිකර්ම දෙපාර්තමේන්තුවට අයත් රජයේ ගව මධ්‍යස්ථාන සහ කෘෂිකර්ම ගොවිපළවලට පහත සඳහන් සත්ව ආහාර සැපයීම සඳහා එවන ටෙන්ඩර් පත්‍ර කොළඹ, යූනියන් පෙදෙසේ පිහිටි කෘෂිකර්ම හා ආහාර අමාත්‍යාංශයේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති තැන විසින්, 1959 ජනවාරි මස 30 වැනි දින පස්වරු 2.30 වන තෙක් භාරගනු ලැබේ.

| සත්ව ආහාර | හය මසකට උවමනා කරන සාමාන්‍ය ප්‍රමාණය—හොණ්ඩර |
|---|---|
| තල පුන්නක්කු ... ... | 2,565 |
| මාළුවන්ගෙන් සාදන කෑම ... | 3,700 |
| කපු ඇට ... ... ... | 510 |
| සුදු ඔස්ට්රේලියානු ඕට්ස් ... | 345 |
| ඉරිඟු කුඩු ... ... | 2,610 |
| තිරිඟු පරළ ... ... | 1,130 |
| විෂ බීජ නැතිකළ ඇට කුඩු ... | 170 |
| ඛනිජ මිශ්‍රණය ... ... | 1,400 |
| කඩල ... ... ... | 105 |
| වියලි කිරමල් ... ... | 110 |

2. ඉහත සඳහන්වන්නේ 1959 අප්‍රේල් 1 වැනි දින සිට හය මාසයක් තුළ උවමනාකරන ප්‍රමාණයන් ය.

3. සත්ව ආහාර හොඳ තත්වයක තිබිමත් හැර පහත සඳහන් විශෙෂ ලක්‍ෂණයන් ද තිබිය යුතුය :—

| සත්ව ආහාර | අදහස් කරන ලද විස්තර | සහතික කළ සංයෝගය | |
|---|---|---|---|
| තල පුන්නක්කු ... | වෙළඳාමට ගතහැකි පිරිසිදු තල ඇටවලින් තෙල් ඉවත් කිරීමෙන් ලබාගන්නකි. | මාංශජනක ධාතු 42–45%, තෙත මනය 10% | පිටස්තර දේ නොතිබිය යුතුය. |
| මාළුවන්ගෙන් සාදන කෑම ... | කුණුනොවන ලද මාළුවන් සහ වැඩකට ගත නොහැකි මාළුවන්ගේ කොටස් වියලීමෙන් සහ ඇඹරීමෙන් සාද ගන්නකි. | මාංශජනක ධාතු 50–55%, ලුනු 4% නොවැඩි, තෙතමනය 10% නොවැඩි | පිටස්තර දේ සහ ගෙන්දගම් නො තිබිය යුතුයි. |
| කපු ඇට ... ... | කපු ඇට ... ... | මාංශජනක ධාතු 22–23%, තෙත මනය 12% නොවැඩි | පිටස්තර දේ නොතිබිය යුතු සහ සතුන් විසින් නොවිදින ලද |
| සුදු ඔස්ට්‍රේලියානු ඕට්ස් ... | ඇට හෝ කුඩුකරන ලද ... | මාංශජනක ධාතු 9–10%, තෙත මනය 12% නොවැඩි | එම |
| ඉරිඟු කුඩු ... ... | — ... | මාංශජනක ධාතු 10%, නොඅඩු, තෙතමනය 10% නොවැඩි | පිටස්තර දේ නොතිබිය යුතුයි. |
| තිරිඟු පරළු ... ... | — ... | මාංශජනක ධාතු 17% නොඅඩු, තෙතමනය 10% නොවැඩි | එම |
| විෂබීජ නැති කළ ඇට කුඩු ... | වෙළඳාමට ගතහැකි පිරිසුදු ඇටකටු තම්බා කුඩුකිරීමෙන් සාදගන්නකි. ඇන්ත්‍රැක්ස් ක්‍ෂුද්‍ර බීජ නැති බවට සහතික කළයුතුයි. | පී2 ඕ5 30–35%, තෙතමනය 10% නොවැඩි | එම |
| ඛනිජ මිශ්‍රණය ... | ... ... | කැල්සියම් 20–22%, ප්‍රකාශද 5·5% සෝඩියම් 11·5–12·5%, ක්ලෝරීන් 18–20%, යකඩ 1–2%. | මැන්ගනීස් කඹ, කොබෝල්ට්, 6·5% අයිඩින් වල මූලික ධාතු සාමාන්‍යයෙන් තිබිය යුතුයි. |
| කඩල ... ... | කඩල ... ... | මාංශජනක ධාතු 22–23%, තෙත මනය 12% නොවැඩි | පිටස්තර දේ නොතිබෙන සතුන් විසින් නොවිදින ලද |
| වියලි බිරමල් ... | බිර සෑදීමෙදී ලබා ගන්නා බීර මල් ... | මාංශ ජනක ධාතු 49% නොඅඩු, තෙතමනය 10% නොවැඩි | — |

4. පෝර්ම කොළ පේරාදෙණියේ, කෘෂිකර්ම අධ්‍යක්‍ෂ තැනගෙන් ලබා ගෙන ඒවායේ ටෙන්ඩර් පත්‍ර එවිය යුතුය. සියලුම ටෙන්ඩර් පත්‍ර අනු පිටපතක් ද සහිතව ලියුම් කවරයක දමා සීල් තබා " සභාපති මහතා, ටෙන්ඩර් මණ්ඩලය, කෘෂිකර්ම හා ආහාර අමාත්‍යාංශය, යුනියන් පෙදෙස, කොළඹ " යන්න ලියා එහිම මුදුන් වම් කොනේ " සත්ව ආහාර සැපයීමේ ටෙන්ඩර් පත්‍රය " යන්නද ලියා එවිය යුතුයි.

5. එක් එක් ටෙන්ඩර් පත්‍රයක් වෙනුවෙන් රුපියල් 100ක් තැන්පත් කළ බවට කුවිතාන්සියක් ඉදිරිපත් කළ යුතුයි. 1959 ජනවාරි 30 වැනි දින දවල් 12 වනතෙක් ටෙන්ඩර් පෝර්ම දෙනු ලැබේ. මේ තැන්පත් කිරීම කච්චේරියක හෝ කොළඹ මහා භාණ්ඩාගාරයේ හෝ කළ යුතුයි. පොරොන්දු පත්‍රය අත්සන් කළ පසු ටෙන්ඩර් තැන්පත් මුදල ආපසු දෙනු ලැබේ. පත් කරගනු ලැබූ ටෙන්ඩර් කරුවාට ඔහුගේ ටෙන්ඩර් පත්‍රය පිළිගත් බැව් දන්වා දස දිනක් ඇතුළතදී අවශ්‍ය ඇපය තැබීමට හෝ පොරොන්දු පත්‍රයක් අත්සන් කිරීමට හෝ නොහැකි වුවහොත් ඔහුගේ ටෙන්ඩර් තැන්පත් මුදල රාජසන්තක වෙනවාත් හැර ඔහුගේ නම රජයේ වැඩ පැහැර හැරිය කොන්ත්‍රාත්කරුවන්ගේ ලැයිස්තුවට ඇතුළත් කිරීමටද ඉඩ තිබේ.

6. ටෙන්ඩර් පත්‍ර කෘෂිකර්ම හා ආහාර අමාත්‍යාංශයේ ටෙන්ඩර් පෙට්ටියේ තැන්පත් කළ යුතුයි. එසේ නැත්නම් ඒවා රෙජිස්ටර් තැපෑලෙන් එවිය යුතුයි. රෙජිස්ටර් තැපෑලෙන් නොඑවන ටෙන්ඩර් පත්‍ර ටෙන්ඩර්කරුවන් විසින් හෝ ඔවුන්ගේ ඒජන්තවරුන් විසින් හෝ ටෙන්ඩර් භාර ගැනීමට බලය දී තිබෙන නිලධාරී තැනවූ කෘෂිකර්ම හා ආහාර අමාත්‍යාංශයේ සහකාර ලේකම් මහතාට අතින්ම භාර දිය යුතුයි. එම ටෙන්ඩර් පත්‍ර බහාලන ලද කවරයෙහි "සත්ව ආහාර සැපයීමේ ටෙන්ඩර් පත්‍රය" යන්න ලියා ටෙන්ඩර්කරුගේ නම සහ ලිපිනයද සඳහන් කළ යුතුයි.

රෙජිස්ටර් තැපෑලෙන් එවන ලද ටෙන්ඩර් පත්‍ර ලැබුණු බව ඒවා විවෘත කරන දිනයේදීම දන්වනු ලැබේ. යම් ටෙන්ඩර් කරුවෙක් විසින් එවැනි දැන්වීමක් ටෙන්ඩර් පත්‍ර විවෘත කිරීමට නියමව තිබූ දින සිට දින 4 ක් ඇතුළත නොලැබුනේ නම්, ඒ ගැන කොළඹ, යුනියන් පෙදෙසේ, කෘෂිකර්ම හා ආහාර අමාත්‍යාංශයේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති තැනගෙන් වහාම විමසිය යුතුයි.

7. ටෙන්ඩර් කරුවන්ට උවමනා නම් ටෙන්ඩර් පත්‍ර විවෘත කරන වේලාවේදී ඉදිරියේ සිටීමට ඉඩ දෙනු ලැබේ. ටෙන්ඩර් පත්‍ර භාර ගැනීම නැවැත්වීමට නියමිත යට කී දිනයේ යට කී වේලාවේදී, කොළඹ, යුනියන් පෙදෙසේ, කෘෂිකර්ම හා ආහාර අමාත්‍යාංශයේදී ඒවා විවෘත කරනු ලැබේ.

8. සෑම ටෙන්ඩර් කරුවෙක් විසින්ම ඔවුන් විසින් ටෙන්ඩර් කරන ලද සෑම සත්ව ආහාර වර්ගයකම රාත්තල් 6ක සැම්පලය බැගින්, "සත්ව ආහාර සැම්පල්" යන්න ලියා 1959 ජනවාරි 30 වැනි දිනට හෝ ඊට පෙර හෝ පේරාදෙණියේ, කෘෂිකර්ම අධ්‍යක්‍ෂ තැනට ලැබීමට සැලැස්විය යුතුයි. සැම්පල් එවීමට නොහැකි වුවහොත් ටෙන්ඩර් පත්‍ර ප්‍රතික්ෂෙප කිරීමට ඉඩ තිබේ. සැම්පල් මිස ටෙන්ඩර් පත්‍ර කෘෂිකර්ම අධ්‍යක්‍ෂ තැනට නොයැවිය යුතුය.

9. නියම පෝර්මයේ ලියා නැති, නැතහොත් එහි නියමිත කොන්දේසි සම්පූර්ණ වශයෙන් ඉටුවී නැති කිසිම ටෙන්ඩර් පත්‍රයක්, ටෙන්ඩර් පත්‍රයක් ලෙස සලකනු නොලැබේ. ප්‍රමාණයන් (Rates) සහ ගණන් පැහැදිලි ලෙස තීන්තෙන් ලකුණු කළ යුතුවාත් හැර ඒවා සම්බන්ධයෙන් යම්කිසි වෙනසක් කළහොත් ඒ තැන්වල ටෙන්ඩර්කරුවාගේ කෙටි අත්සනද තැබිය යුතුවේ. ටෙන්ඩර් කරන ලද ගණන් අකුරුවලින් සහ ඉලක්කම් වලින්ද ලිවිය යුතුය. ඉලක්කම් වලින් ලියන ලද ගණන් වචන වලින් සඳහන් කරන ගණන් වලට වෙනස්වුවහොත් ටෙන්ඩරය ප්‍රතික්ෂෙප කිරීමට ඉඩ තිබේ.

10. ටෙන්ඩර් කරුවන් තම ලිපිනය පැහැදිලි අකුරෙන් ටෙන්ඩර් පත්‍රයෙහි ලිවිය යුතුය.

11. පළමුවෙනි වාක්‍ය ඛණ්ඩයෙහි සඳහන් සත්ව ආහාර සියල්ලටම හෝ එකකට හෝ ටෙන්ඩර් කළ හැක.

12. උවමනා අවස්ථාවක සත්ව ආහාර උවමනා ප්‍රමාණ සැපයීමට ටෙන්ඩර්කරුට පුළුවන්විය යුතුයි. මේ වග කෘෂිකර්ම අධ්‍යක්‍ෂ තැන විසින් හෝ ඔහුගේ නියෝජිතයෙකු විසින් හෝ සත්ව ආහාර තොගය යැවිය යුතු ළඟම දුම්රිය පළද සඳහන්කර තෝරා ගන්නා ලද ටෙන්ඩර්කරුවාට විටින් විට දන්වනු ලැබේ.

13. ටෙන්ඩරය භාරගත් බව දන්වා දස දිනක් ඇතුළත උවමනා ප්‍රමාණ සත්ව ආහාර සැපයීමට ටෙන්ඩර් කරුවන්ට හැකිවිය යුතුයි.

14. තෝරා ගන්නා ලද ටෙන්ඩර්කරු විසින් සත්ව ආහාර යවන අවස්ථාවේදී ඒවායින් සැම්පලයක් පරීක්‍ෂණයකට භාජන කළ යුතුයි. කෘෂිකර්ම අධ්‍යක්‍ෂ තැන විසින් නම් කරන ලද නිලධාරියෙකුට විභාග කර බැලීම සඳහා සැම්පල් ගැනීමට පහසුකම් සැලැස්විය යුතුයි. මේ සැම්පල් නියම තත්වයට නොතිබුණි නම් සපයන ලද සියලුම සත්ව ආහාර ටෙන්ඩර් කරුහට දුම්රිය ගාස්තු ගෙවා භාර ගැනීමට ආපසු එවනු ලබේ.

15. ටෙන්ඩරයෙහි සඳහන් කළ මිල ගණන් දුම්රිය පෙට්ටිවලට පටවන ශුද්ධ බර ප්‍රමාණය අනුව විය යුතුයි. පැටවුම් ගාස්තු දෙපාර්තමේන්තුවෙන් ගෙවනු නොලැබේ. තෝරා ගන්නා ලද ටෙන්ඩර් කරුවාට ඔහුගේ ගබඩාවත් බඩු එවන දුම්රිය ස්ථානයත් අතර සත්ව ආහාර ගෙන යැමට යන වියදම දරන්ට සිදුවේ.

16. ටෙන්ඩර් පත්‍රයේ සඳහන්වූද, පිළිගනු ලැබුවාවූද, සත්ව ආහාර වලට යන මුළු වියදමෙන් සියයට පහක ඇප මුදලක් කෘෂිකර්ම අධ්‍යක්‍ෂ තැනගේ නමින් තැන්පත් කිරීමටත්, පොරොන්දු පත්‍රයක් අත්සන් කිරීමටත් පත්කරගනු ලැබූ ටෙන්ඩර්කරුවාට නියම කරනු ලැබේ. මේ මුදල ආපසු දෙන්නේ මේ කොන්ත්‍රාත්තුව නිසි පරිදි ඉටු කොට නිමවූ විට පමණකි. පත් කරන ලද ටෙන්ඩර්කරුවා මේ කොන්ත්‍රාත්තුව ඉටු නොකළ හොත් ඔහුගේ ඇප මුදල රාජසන්තක වෙනවා පමණක් නොව, ඔහුගේ නම ආණ්ඩුවේ වැඩ පැහැර හැරිය කොන්ත්‍රාත් කාරයින්ගේ ලැයිස්තුවට ඇතුළත් වෙනවාද ඇත.

16. ටෙන්ඩර් පත්‍රයේ සඳහන් කරන සියලුම මිල ගණන් යටත් පිරිසෙයින් සති 3කට වත් වෙනස් නොවන ස්ථිර ඒවා විය යුතුයි.

17. වැඩි විස්තර යාපනේ කෘෂිකර්ම කායඝිලයේ පාලන නිලධාරි තැනගෙන් දැනගත හැක.

ඇම්. ඇෆ්. චන්ද්‍රරත්න,
කෘෂිකර්ම අධ්‍යක්ෂ.

1958 දෙසැම්බර් මස 31 දින,
පේරාදෙනියේදීය.

---

## කෘෂිකර්ම දෙපාර්තමේන්තුව

### කිලිනොච්චිය සහ පරන්තන්ගි ගොවිපලවල ගොයම් කැපීම හා ගොඩගැසීම

යාපනේ, කෘෂිකර්ම කායඝිලයේ පාලන නිලධාරි තැන විසින් කිලිනොච්චියේ ගොවිපලේ අක්කර 60ක් සහ පරන්තන්ගි ගොවිපලේ අක්කර 25ක ගොයම් කපා ගොඩගැසීම සඳහා ටෙන්ඩර් පත්‍ර 1959 ජනවාරි මස 30 දින පස්වරු 2.30 වනතෙක් භාරගනු ලැබේ.

(අ) ගොයම් කැපීම 1959. 2. 15 දින පටන් ගෙන ගොයම් පැසී සතියක් ඇතුලතදී කැපිය යුතුයි.

(ආ) අඩු වශයෙන් දවසකට අක්කර දහයක ගොයම් කැපිය යුතුයි. එසේ කපන ලද ගොයම් තෙත නොතිබේනම් දවස් දෙකක් ඇතුලතදී ගොඩගැසිය යුතුයි. මෙසේ කිරීමේදී වී ඇට නැති වීමට හෝ වෙනත් හානියක් සිදුවීමට ඉඩ නොතිබිය යුතුයි. ඉපනැල්ල අඟල් 6කට වඩා කුඹුරේ ඉතිරි නොකළ යුතුයි.

(ඉ) අක්කරයක ගොයම් කැපීම සහ ගොඩගැසීම පිණිස මිල ගණන් සඳහන් කළ යුතුයි. තෝරා ගන්නා ලද ටෙන්ඩර්කරු ඉහත සඳහන් අක්කර ප්‍රමාණයන් මුළුමණින්ම හෝ ඉන් කොටසක් භාර ගැනීමට සූදානම් විය යුතුයි. ගොවිපලේ කළමනාකාර තැන හෝ ඔහුගේ නියෝජිතයා විසින් නියම කරනලද කාල සීමාව තුළදී මුළු වැඩයම සතුටුදායක අන්දමින් නිම කළ යුතුයි.

2. යාපනේ කෘෂිකර්ම කායඝිලයේ පාලන නිලධාරි තැනගෙන් ෆෝර්ම කොළ ලබාගෙන ටෙන්ඩර් පත්‍ර ඒවායෙහි එවිය යුතුයි. සියලුම ටෙන්ඩර් පත්‍ර ලියුම් කවරයක දමා සීල් තබා "පාලන නිලධාරි තැන, කෘෂිකර්ම කායඝිලය, යාපනය" යන්න එහි පිට ලියා එහිම මුදුනේ වම් කොනෙහි "ගොයම් කැපීමේ හා ගොඩගැසීමේ ටෙන්ඩර් පත්‍රය" යන්න ලියා එවිය යුතුයි.

3. ටෙන්ඩර් පත්‍ර රිජිස්ටර් තැපෑලෙන් එවිය යුතුයි. ටෙන්ඩර් පත්‍ර රෙජිස්ටර් තැපෑලෙන් නොඑවතොත් ටෙන්ඩර්කරුවන් හෝ ඔවුන්ගේ නියෝජිතයන් හෝ විසින් යාපනේ කෘෂිකර්ම කායඝිලයේ පාලන නිලධාරි තැනට ඒවා අතින්ම භාර දිය යුතුයි. ටෙන්ඩර් පත්‍ර බහාලන ලද කවරයෙහි "ගොයම් කැපීම හා ගොඩගැසීමේ ටෙන්ඩර් පත්‍රය" යන්න ලියා ටෙන්ඩර්කරුගේ නම සහ ලිපිනයද සඳහන් කළ යුතුයි.

4. රෙජිස්ටර් තැපෑලෙන් එවන ලද ටෙන්ඩර් පත්‍ර ලැබුණු බව ඒවා විවෘත කරන දිනයේදීම සියලු ටෙන්ඩර්කරුවන්ට දන්වනු ලැබේ. ටෙන්ඩර් පත්‍ර භාර ගැනීම නැවැත්වීමට නියමිත දින සිට දින හතරක් ඇතුළත යම් ටෙන්ඩර්කරුවකුට එවැනි දැන්වීමක් නොලැබුණොත් ඔහු යාපනේ කෘෂිකර්ම කායඝිලයේ පාලන නිලධාරි තැනගෙන් වහාම ඒ ගැන කරුණු විමසිය යුතුයි.

5. ටෙන්ඩර් පත්‍ර භාර ගන්නා අවසාන දින දවල් 12 වනතෙක් ටෙන්ඩර් ෆෝර්ම දෙනු ලැබේ. ඒ දීම කරන්නේ එක් එක් ටෙන්ඩර් පත්‍රයක් වෙනුවෙන් රුපියල් 10ක් තැන්පත් කළ බවට කුවිතාන්සියක් ඉදිරිපත් කළ පසුවය. මේ තැන්පත් කිරීම කච්චේරියක හෝ මහා භාණ්ඩාගාරයේ හෝ කළ යුතුයි. පොරොන්දු පත්‍රය අත්සන් කළ පසු ටෙන්ඩර් තැන්පත් මුදල ආපසු දෙනු ලැබේ. පත්කර ගනු ලැබූ ටෙන්ඩර්කරුවාට ඔහුගේ ටෙන්ඩර් පත්‍රය පිළිගත් බව දන්වා 10 දිනක් ඇතුලතදී අවශ්‍ය ඇපය තැබීමට හෝ පොරොන්දු පත්‍රයක් අත්සන් කිරීමට හෝ නොහැකි වුවහොත් ඔහුගේ ටෙන්ඩර් තැන්පත් මුදල රාජසන්තක වෙනවාත් හැර ඔහුගේ නම ආණ්ඩුවේ වැඩ පැහැර හැරිය කොන්ත්‍රාත්කරුවන්ගේ ලැයිස්තුවට ඇතුලත් වෙන්ට ඉඩ තිබේ.

6. නියමිත ෆෝර්මයේ ලියා නැති, නැතහොත් එහි නියමිත කොන්දේසි සම්පූර්ණ වශයෙන් ඉටුවී නැති කිසිම ටෙන්ඩර් පත්‍රයක්, ටෙන්ඩර් පත්‍රයක් ලෙස සලකනු නොලැබේ. ටෙන්ඩර් ප්‍රමාණයන් සහ ගණන් පැහැදිලි ලෙස තීන්තෙන් ලකුණු කළ යුතුවාත් හැර ඒවා සම්බන්ධයෙන් යම්කිසි වෙනසක් කළහොත් ඒ තැන්වල ටෙන්ඩර්කරුවාගේ කෙටි අත්සන තැබිය යුතුද වේ.

7. ටෙන්ඩර්කරුවන් තම ලිපිනය පැහැදිලි අකුරින් ටෙන්ඩර් පත්‍රයෙහි ලිවිය යුතුයි.

8. ටෙන්ඩර් පත්‍රයේ සඳහන් වූද පිළිගනු ලැබුවා වූද දේවල මුළු වියදමෙන් සියයට පහක ඇප මුදලක් කෘෂිකර්ම අධ්‍යක්ෂ තැනගේ නමින් තැන්පත් කිරීමටත් පොරොන්දු පත්‍රයක් අත්සන් කිරීමටත් පත් කරගනු ලැබූ ටෙන්ඩර්කරුවාට නියම කරනු ලැබේ. මේ මුදල ආපසු දෙන්නේ මේ කොන්ත්‍රාත්තුව නිසි පරිදි ඉටු කොට නිමවූ විට පමණකි. පත් කරගනු ලැබූ ටෙන්ඩර්කරුවා මේ කොන්ත්‍රාත්තුව ඉටු නොකළහොත් ඔහුගේ ඇප මුදල රාජසන්තක වෙනවා පමණක් නොව ඔහුගේ නම ආණ්ඩුවේ වැඩ පැහැර හැරිය කොන්ත්‍රාත්කරුවන්ගේ ලැයිස්තුවට ඇතුලත් වෙනවාද ඇත.

9. පොරොන්දු පත්‍රයට හා/හෝ ඔප්පුවට ඇලවිය යුතු මුද්දරවල වටිනාකම පත් කරගනු ලැබූ ටෙන්ඩර්කරුවා විසින් ගෙවිය යුතුයි.

10. යම්කිසි ටෙන්ඩර් පත්‍රයක් හෝ සියලුම ටෙන්ඩර් පත්‍ර ප්‍රතික්ෂේප කිරීමේත්, ටෙන්ඩර් පත්‍රයක යම්කිසි කොටසක් පිළිගැනීමේත් බලය කෘෂිකර්ම අධ්‍යක්ෂ වෙත තබා ගනී.

11. පත් කරගනු ලැබූ ටෙන්ඩර්කරුවා විසින් ටෙන්ඩර් පත්‍රයේ සඳහන් වැඩය කිරීම සඳහා ලාංකික කම්කරුවන් පමණක් ගත යුතුය. "ලාංකිකයා" යන වචනයේ අර්ථය නම් පරම්පරාවෙන් හෝ ලියාපදිංචිකරවා ගැනීමෙන් හෝ ලංකාවේ පුරවැසියෙක්වූ තැනැත්තෙක්ය යන්නයි.

12. 1934රේ 19 වැනි අංකය දරණ කම්කරු වන්දි ආඥාපනතේ (117 වැනි පරිච්ඡේදය) යටතේ තමාගේ යම්කිසි සේවකයෙකු හෝ සේවකයෙකු වෙනුවෙන් වන්දි ඉල්ලා එවන ඉල්ලුම් පත්‍ර ගැන වගකීමෙන් කොන්ත්‍රාත්කරුවා ආණ්ඩුව නිදහස් කළ යුතුයි.

13. කොන්ත්‍රාත්කාරයාට බාරදිය යුතු සියලු දැන්වීම් ඔහුගේ අතට දුන්නොත් නැතහොත් ඔහු විසින් සඳහන් කර ඇති ලිපිනයට තැපෑලෙන් යැව්වොත් ඔහු අතටම භාර දුන්නා කොට සැළකිය යුතුයි.

14. වැඩට ගැනීමට නුසුදුසු යයි කල්පනා කරනු ලබන යම්කිසි කම්කරුවකු කොන්ත්‍රාත්කරුවා වැඩට ගැනීම ගැන විරුද්ධවීමේ හෝ ඕනෑම කම්කරුවකු වැඩට ගැනීම ගැන විරුද්ධවීමේ හෝ බලය ආණ්ඩුවට තබාගනු ලැබේ.

15. වැඩ පැහැර හැරිය කොන්ත්‍රාත්කරුවන් පිළිබඳ ආණ්ඩුවේ ලැයිස්තුවට තනිතනිව හෝ ඒ ලැයිස්තුවේ නම සඳහන් වෙන කෙනෙකුගේ නම සමඟ හෝ නම ඇතුලත්වූ හෝ තමාට සෑහේ යයි පෙනී යන හේතු පිට කෘෂිකර්ම අධ්‍යක්ෂ තැන විරුද්ධ වන හෝ කිසිවකු සමඟ කොන්ත්‍රාත්තුවකට බැඳෙනු නොලැබේ.

16. ටෙන්ඩර් පත්‍රයේ සඳහන් කරන සියලුම මිල ගණන් යටත් පිරිසෙයින් සති 3කට වත් වෙනස් නොවන ස්ථිර ඒවා විය යුතුයි.

17. වැඩි විස්තර යාපනේ කෘෂිකර්ම කායඝිලයේ පාලන නිලධාරි තැනගෙන් දැනගත හැක.

ඇම්. ඇෆ්. චන්ද්‍රරත්න,
කෘෂිකර්ම අධ්‍යක්ෂ.

1958 දෙසැම්බර් මස 31 දින,
පේරාදෙනියේදීය.

---

## කෘෂිකර්ම දෙපාර්තමේන්තුව

### යාපනේ දිස්ත්‍රික්කයේ ගොවිපලට වියන ලද පොල් අතු සැපයීම

පේරාදෙණියේ කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ ටෙන්ඩර් පත්‍ර මණ්ඩලයේ සභාපති තැන විසින් පහත සඳහන් ගොවිපලවලට දිගින් අඩි 6ක් සහ වියන ලද ප්‍රමාණය අඟල් 12කට නොඅඩු වියන ලද ඉරු දෙකේ පොල් අතු ගෙනැවිත් භාරදීම සඳහා ටෙන්ඩර් පත්‍ර 1959 ජනවාරි මස 30 වැනි දින පස්වරු 2.30 වනතෙක් භාරගනු ලැබේ :—

| | |
|---|---|
| යාපනේ කෘෂිකර්ම පාසලට ... ... | 15,000 |
| පරන්තන්ගි වී ගොවිපලට ... ... | 15,000 |
| කිලිනොච්චියේ කෘෂිකර්ම ගොවිපලට ... | 15,000 |
| යාපනේ කාන්තා කෘෂිකර්ම පාසලට ... | 3,000 |

අළුතෙන් ඉදි කෙරෙන ගොඩනැගිලි සඳහා නවත් පොල් අතු 20,000ක් පමණ මෙම මුදල් වර්ෂය තුළ උවමනා වුවහොත් කොන්ත්‍රාත්කරුට ඒවාද සැපයීමට හැකි විය යුතුයි.

2. යාපනේ කෘෂිකර්ම කාර්යාලයේ පාලන නිලධාරි තැන ගෙන් පෝරම කොළ ලබාගෙන ටෙන්ඩර් පත්‍ර ඒවායෙහි එවිය යුතුයි. සියලුම ටෙන්ඩර් පත්‍ර ලියුම් කවරයක දමා සීල් තබා "සභාපති මහතා, ටෙන්ඩර් මණ්ඩලය, කෘෂිකර්ම දෙපාර්තමේන්තුව, පේරාදෙණිය" යන්න එහි පිට ලියා එහිම මුදුනේ වම් කොනෙහි "යාපනේ දිස්ත්‍රික්කයට පොල් අතු සැපයීමේ ටෙන්ඩර් පත්‍රය" යන්න ලියා එවිය යුතුයි.

3. ටෙන්ඩර් පත්‍ර රිජිස්ටර් තැපෑලෙන් එවිය යුතුයි. ටෙන්ඩර් පත්‍ර රෙජිස්ටර් තැපෑලෙන් නොඑවතොත් ටෙන්ඩර්කරුවන් හෝ ඔවුන්ගේ නියෝජිතයන් හෝ විසින් පේරාදෙණියේ කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ ටෙන්ඩර් පත්‍ර සම්බන්ධව කටයුතු කරන ලිපිකරු තැනට ඒවා අතින්ම භාර දිය යුතුයි. ටෙන්ඩර් පත්‍ර බහාලන ලද කවරයෙහි "යාපනේ දිස්ත්‍රික්කයට පොල් අතු සැපයීමේ ටෙන්ඩර් පත්‍රය" යන්න ලියා ටෙන්ඩර්කරුගේ නාම සහ ලිපිනයද සඳහන් කළ යුතුයි.

4. රෙජිස්ටර් තැපෑලෙන් එවන ලද ටෙන්ඩර් පත්‍ර ලැබුණු බව ඒවා විවෘත කරන දිනයේදී ම සියලුම ටෙන්ඩර්කරුවන්ට දන්වනු ලැබේ. ටෙන්ඩර් පත්‍ර භාර ගැනීම නැවැත්වීමට නියමිත දින සිට දින හතරක් ඇතුළත යම් ටෙන්ඩර්කරුවකුට එවැනි දැන්වීමක් නොලැබුණොත් ඔහු පේරාදෙණියේ කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ ටෙන්ඩර් පත්‍ර මණ්ඩලයේ සභාපති තැනගෙන් වහාම ඒ ගැන කරුණු විමසිය යුතුයි.

5. ටෙන්ඩර්කරුවන්ට උවමනා නම් ටෙන්ඩර් පත්‍ර විවෘත කරන වේලාවේ දී ඉදිරියේ සිටීමට ඉඩ දෙනු ලැබේ. ටෙන්ඩර් පත්‍ර භාර ගැනීම නැවැත්වීමට නියමිත යට කී දිනයේ යට කී වේලාවේ දී ඒවා කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්යාලයේ දී විවෘත කරනු ලැබේ.

6. ටෙන්ඩර් පත්‍ර භාර ගන්නා අවසාන දින දවල් 12 වනතෙක් ටෙන්ඩර් පෝරම දෙනු ලැබේ. ඒ දීම කරන්නේ එක් එක් ටෙන්ඩර් පත්‍රයක් වෙනුවෙන් රුපියල් 10ක් තැන්පත් කළ බවට කුවිතාන්සියක් ඉදිරිපත් කළ පසුවය. මේ තැන්පත් කිරීම කච්චේරියක හෝ මහා භාණ්ඩාගාරයේ හෝ කළ යුතුයි. පොරොන්දු පත්‍රය අත්සන් කළ පසු ටෙන්ඩර් තැන්පත් මුදල ආපසු දෙනු ලැබේ.

පත්කරගනු ලැබූ ටෙන්ඩර්කරුවාට ඔහුගේ ටෙන්ඩර් පත්‍රය පිළිගත් බව දන්වා 10 දිනක් ඇතුළත දී අවශ්‍ය ඇපය තැබීමට හෝ පොරොන්දු පත්‍රයක් අත්සන් කිරීමට හෝ නොහැකි වූවහොත් ඔහුගේ ටෙන්ඩර් තැන්පත් මුදල රාජසන්තක වෙනවාත් හැර ඔහුගේ නම ආණ්ඩුවේ වැඩ පැහැර හැරිය කොන්ත්‍රාත්කරුවන්ගේ ලැයිස්තුවට ඇතුළත් වෙන්ට ඉඩ තිබේ.

7. නියමිත පෝරමයේ ලියා නැති, නැතහොත් එහි නියමිත කොන්දේසි සම්පූර්ණ වශයෙන් ඉටුවී නැති කිසිම ටෙන්ඩර් පත්‍රයක්, ටෙන්ඩර් පත්‍රයක් ලෙස සලකනු නොලැබේ. ටෙන්ඩර් ප්‍රමාණයන් සහ ගණන් පැහැදිලි ලෙස තීන්තෙන් ලකුණු කළ යුතුවාත් හැර ඒවා සම්බන්ධයෙන් යම්කිසි වෙනසක් කළහොත් ඒ තැන්වල ටෙන්ඩර්කරුවාගේ කෙටි අත්සන තැබිය යුතුද වේ.

8. ටෙන්ඩර්කරුවන් තම ලිපිනය පැහැදිලි අකුරින් ටෙන්ඩර් පත්‍රයෙහි ලිවිය යුතුයි.

9. ටෙන්ඩර් පත්‍රයේ සඳහන්වූද, පිළිගනු ලැබූවාවූද, ද්‍රව්‍යවල මුළු වියදමෙන් සියයට පහක ඇප මුදලක් කෘෂිකර්ම අධ්‍යක්ෂ තැනගේ නමින් තැන්පත් කිරීමටත්, පොරොන්දු පත්‍රයක් අත්සන් කිරීමටත්, පත්කරගනු ලැබූ ටෙන්ඩර්කරුවාට නියම කරනු ලැබේ. මේ මුදල ආපසු දෙන්නේ මේ කොන්ත්‍රාත්තුව නිසි පරිදි ඉටු කොට නිමවූ විට පමණකි. පත්කරගනු ලැබූ ටෙන්ඩර්කරුවා මේ කොන්ත්‍රාත්තුව ඉටු නොකළ හොත් ඔහුගේ ඇප මුදල රාජසන්තක වෙනවා පමණක් නොව ඔහුගේ නම ආණ්ඩුවේ වැඩ පැහැර හැරිය කොන්ත්‍රාත්කරුවන්ගේ ලැයිස්තුවට ඇතුළත් වෙනවාද ඇත.

10. පොරොන්දු පත්‍රයට හා/හෝ ඔප්පුවට ඇලවිය යුතු මුද්දරවල වටිනාකම පත්කර ගනු ලැබූ ටෙන්ඩර්කරුවා විසින් ගෙවිය යුතුයි.

11. යම්කිසි ටෙන්ඩර් පත්‍රයක් හෝ සියලුම ටෙන්ඩර් පත්‍ර ප්‍රතික්ෂෙප කිරීමේත්, ටෙන්ඩර් පත්‍රයක කොටසක් පිළිගැනීමේත් බලය කෘෂිකර්ම අධ්‍යක්ෂ වෙත තබා ගනී.

12. පත්කරගනු ලැබූ ටෙන්ඩර්කරුවා විසින් ටෙන්ඩර් පත්‍රයේ සඳහන් වැඩය කිරීම සඳහා ලාංකික කම්කරුවන් පමණක් ගත යුතුය. "ලාංකිකයා" යන වචනයේ අර්ථය නම් පරම්පරාවෙන් හෝ ලියාපදිංචි කරවා ගැනීමෙන් හෝ ලංකාවේ පුරවැසියෙක් වූ තැනැත්තෙක්ය යන්නයි.

13. 1934ජේ 19 වැනි අංකය දරණ කම්කරු වන්දි ආඥපනත (117 වැනි පරිච්ඡේදය) යටතේ තමාගේ යම්කිසි සේවකයෙකු හෝ සේවකයෙකු වෙනුවෙන් වන්දි ඉල්ලා එවන ඉල්ලුම් පත්‍ර ගැන වගකීමෙන් කොන්ත්‍රාත්කරුවා ආණ්ඩුව නිදහස් කළ යුතුයි.

14. කොන්ත්‍රාත්කාරයාට භාර දිය යුතු සියලු දැන්වීම් ඔහුගේ අතට දුන්නොත් නැතහොත් ඔහු විසින් සඳහන් කර ඇති ලිපිනයට තැපෑලෙන් යැව්වොත් ඔහු අතටම භාර දුන්නා කොට සැලකිය යුතුයි.

15. වැඩට ගැනීමට නුසුදුසු යයි කල්පනා කරනු ලබන යම්කිසි කම්කරුවෙකු කොන්ත්‍රාත්කරුවා වැඩට ගැනීම ගැන විරුද්ධවීමේ හෝ ඕනෑම කම්කරුවෙකු වැඩට ගැනීම ගැන විරුද්ධවීමේ හෝ බලය ආණ්ඩුවට තබාගනු ලැබේ.

16. වැඩ පැහැර හැරිය කොන්ත්‍රාත්කරුවන් පිළිබඳ ආණ්ඩුවේ ලැයිස්තුවට තනි තනිව හෝ ඒ ලැයිස්තුවේ නම සඳහන් වෙන කෙනෙකුගේ නම සමග හෝ නම ඇතුළත්වූ හෝ තමාට සැහේ යයි පෙනී යන හේතු පිට කෘෂිකර්ම අධ්‍යක්ෂ තැන විරුද්ධ වන හෝ කිසිවකු සමග කොන්ත්‍රාත්තුවකට බැදෙනු නොලැබේ.

17. ටෙන්ඩර් පත්‍රයේ සඳහන් කරන සියලුම මිල ගණන් යටත් පිරිසෙයින් සති 3කට වත් වෙනස් නොවන සවිර ඒවා විය යුතුයි.

18. වැඩි විස්තර යාපනේ කෘෂිකර්ම කාර්යාලයේ පාලන නිලධාරි තැනගෙන් දැනගත හැක.

ඇම්. ඇෆ්. චන්ද්‍රරත්න,
කෘෂිකර්ම අධ්‍යක්ෂ.

1959 ජනවාරි 1 වැනි ද,
පේරාදෙණියේ දීය.

---

## වාරිමාර්ග දෙපාර්තමේන්තුව

පොළොන්නරුව ඊසාන ප්‍රදේශීය වාරිමාර්ග ඉංජිනේරු තුමා විසින් මින්නේරියේ වාරිමාර්ග ඉංජිනේරු නිවාසයක් හා උප කොට්ඨාශීය වාරිමාර්ග කාර්යාලයක් ගොඩනැගීම සඳහා මෙම දෙපාර්තමේන්තුවේ රුපියල් 40,000ට හෝ ඉන් ඉහළ ලියාපදිංචි වී ඇති කොන්ත්‍රාත්කරුවන්ගෙන් වෙන වෙන ටෙන්ඩර් පත්‍ර 1959 ජනවාරි මස 21 වෙනි බදාදා පෙරවරු 9.30 දක්වා භාරගනු ලැබේ.

1959 ජනවාරි මස 15 වෙනි දින සිට 19 වෙනි දින දක්වා හිඟුරක්ගොඩ, තමන්කඩුව උප කොට්ඨාශයේ වාරිමාර්ග ඉංජිනේරු තුමා විසින් ටෙන්ඩර් පත්‍රිකා නිකුත් කරනු ලැබේ. ටෙන්ඩර් පත්‍ර ලබාගනු කැමැත්තන් විසින් එක එක ටෙන්ඩර් පත්‍රයකට රුපියල් 50ක් බැගින් තමන්කඩුව උප කොට්ඨාශයේ වාරිමාර්ග ඉංජිනේරු තුමා වෙත තැන්පත් කළ යුතුය.

මේ සම්බන්ධ සියලු විස්තර සඳහා තමන්කඩුව උප කොට්ඨාශයේ වාරිමාර්ග ඉංජිනේරු තුමාගෙන් විමසන්න.

ජී. ඇස්. ඇම්. ශොක්මන්,
වාරිමාර්ග ඉංජිනේරුතැන,
තමන්කඩුව උප කොට්ඨාශය.

වාරිමාර්ග කාර්යාලය, හිඟුරක්ගොඩ,
1.1.59.

---

## වාරිමාර්ග දෙපාර්තමේන්තුව

පොළොන්නරුවේ ඊසාන ප්‍රදේශීය වාරිමාර්ග ඉංජිනේරු තුමා විසින් මින්නේරිය ව්‍යාපාරයේ ඇලහැර-මින්නේරිය යෝධ ඇල පාරේ 13 වෙනි සැතැපුමේ ගල් දමා තාර දැමීම සඳහා මෙම දෙපාර්තමේන්තුවේ රුපියල් 45,000ට හෝ ඉන් ඉහළ ලියා පදිංචි වී ඇති කොන්ත්‍රාත්කරුවන්ගෙන් ටෙන්ඩර් පත්‍ර 1959 ජනවාරි මස 21 වෙනි බදාදා පෙරවරු 9.30 දක්වා භාරගනු ලැබේ.

## ජාතික නිවාස දෙපාර්තමේන්තුව

### ගාල්ලේ බටදූව 1 ඩබ්ලිව් වශීයේ ගෙවල් 20ක් සහ ළිං 2ක් තැනීම

ගාල්ලේ බටදූව නමැති ගමෙහි 1 ඩබ්ලිව් වශීයේ ගෙවල් 20ක් සහ ළිං 2ක් තැනීම සඳහා ජාතික නිවාස ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති විසින් 1959 පෙබරවාරි මස 13 වෙනි සිකුරාද පෙරවරු 10 වන තුරු ටෙන්ඩර් බාර ගනු ලැබේ. ටෙන්ඩර් පත්‍ර එදින එකී වේලාවට විවෘත කරන විට ටෙන්ඩර්කරුවන්ට පැමිණ සිටිය හැක.

පිටපත් දෙකකින් යුත් ටෙන්ඩර් පත්‍ර මෙම දෙපාර්තමේන්තුවේ නිර්මාණක ඉංජිනේරු තැනගෙන් ලබාගත හැකිවා මෙන්ම වැඩි විස්තර ද ඔහුගෙන් ලබාගත හැක.

ප්‍රසිඞ් වැඩ දෙපාර්තමේන්තුවේ ගොඩනැගිලි කර්මාන්ත වැඩ සඳහා රුපියල් 75,000කට හෝ ඊට වැඩි ගණනකට ලියා පදිංචි කරන ලද කොන්ත්‍රාත්කරුවෝ පමණක් ටෙන්ඩර් පත්‍ර ඉදිරිපත් කිරීමට සුදුස්සෝ වෙති. එම ලියා පදිංචි කරන ලද සහතිකය සහ මෙම දෙපාර්තමේන්තුවේ සරප් තැන වෙත රුපියල් 75ක තැන්පත් මුදලක් තැබූ බවට කුවිතාන්සියක් ඉදිරිපත් කරන අයවලුන්ට 1959 පෙබරවාරි මස 11 වෙනි බදාදා දවල් 12 වන තුරු ටෙන්ඩර් පත්‍ර නිකුත් කරනු ලැබේ.

රෙ. ලෝ. ආර්නෝල්ඩා,
ජාතික නිවාස කොමසාරිස් තැන.

ජාතික නිවාස දෙපාර්තමේන්තුව,
තැපැල් පෙට්ටිය නො. 544,
කොළඹ 1. ජනවාරි 3, 1959.

---

### කොළඹ පිහිටි සිවිල් බෙහෙත් ගබඩාවන්හි බඩු කාමර දෙකකට වායු සමන යන්ත්‍ර සැපයීම සහ පිහිටුවීම

ඉහත සඳහන් වැඩය සඳහා ටෙන්ඩර් පත්‍ර වෂ් 1959ක් වූ පෙබරවාරි මස 18 වන බදාදා පූ.භා. 9.30 දක්වා ප්‍රවාහණ සහ රජයේ වැඩ පිළිබඳ අමාත්‍යාංශයේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති තැන (තැ. පෙ. 547, කොළඹ) විසින් බාරගනු ලැබේ.

2. ටෙන්ඩර් පත්‍ර සම්බන්ධව ලියකියවිලි කොළඹ මැකලම් පාරේ පිහිටි කොන්ත්‍රාත් හා සැපයීම් භාර විදුලි ඉංජිනේරු තැනගේ කාර්යාලයෙහි දී කියවා බලා ගත හැක. ටෙන්ඩර් පත්‍ර ඉදිරිපත් කිරීමට අදහස් කරන අයවලුන් විසින් රු. 100ක මුදලක් ටෙන්ඩර් තැන්පත් මුදල වශයෙන් ද, රු. 5ක් මුදලක් ටෙන්ඩර් පෝර්ම සැපයීමේ ගාස්තුව වශයෙන් ද, රජයේ විදුලි දෙපාර්තමේන්තුවේ සරප් තැන වෙත ගෙවා ලබාගත් කුවිතාන්සි කොන්ත්‍රාත් හා සැපයීම් භාර විදුලි ඉංජිනේරු තැන වෙත ඉදිරිපත් කළ විට ටෙන්ඩර් පෝර්ම නිකුත් කරනු ලැබේ. ටෙන්ඩර් පෝර්ම සැපයීමේ ගාස්තුව වන රු. 5ගේ මුදල ආපසු ගෙවනු නොලැබේ. ටෙන්ඩර් තැන්පත් මුදල වන රු. 100 ය ටෙන්ඩර් කොන්දේසි උඩ ආපසු ගෙවනු ලැබේ.

3. ටෙන්ඩර් පත්‍ර ඉදිරිපත් කළ යුත්තේ ඉහත කී අයුරු ලබාගත් ටෙන්ඩර් පෝර්ම වලයි. වෂ් 1959ක් වූ පෙබරවාරි මස 13 වන දින වන තෙක් ටෙන්ඩර් පෝරම නිකුත් කරනු ලැබේ.

4. වෂ් 1959ක් වූ පෙබරවාරි මස 18 වන දින අ. භා. 2.30ට ප්‍රවාහණ හා වැඩ පිළිබඳ අමාත්‍යාංශයේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති තැනගේ කායඝීලයෙහිදී ටෙන්ඩර් පත්‍ර විවෘත කරන අවසථාවේදී ටෙන්ඩර්කරුවන්ට පෙනී සිටීමට අවසර ඇත.

ඊ. සී. ප්‍රනාන්දු,
රජයේ විදුලි දෙපාර්තමේන්තුවේ
ප්‍රධාන කළමනාකාර තැන.

1959ක් වූ ජනවාරි මස 9 වන දින,
තැ. පෙ. 540,
කොළඹ.

---

## බන්ධනාගාර දෙපාර්තමේන්තුව

### වෝනෝ වශීයේ ඒකාබද්ධ කොයිල් ස්ප්‍රිං, පට්ටම් කන්නාඩි ආදිය සැපැයීම සඳහා ඉල්ලුම් පත්‍ර භාර ගැනීමයි

1959 ජනවාරි මස 20 වැනි අඟහරුවාදා පෙරවරු 9.30 දක්වා පහත සඳහන් ද්‍රව්‍යයන් වැලිකඩ බන්ධනාගාරයට සැපැයීම සඳහා මෙහි පහත අත්සන් කරන ලද අය විසින් මිළ ගණන් ඇතුළත් ඉල්ලුම් පත්‍ර භාර ගනු ලැබේ:—

| | | | |
|---|---|---|---|
| 80 | — | වෝනෝ වශීයේ ඒකාබද්ධ කොයිල් ස්ප්‍රිං | 6′ × 3′ |
| 20 | — | පට්ටම් කණ්නාඩි | 16″ × 48″ |
| 30 | — | එම | 18″ × 14″ |
| 10 | — | එම | 10″ × 7″ |
| 5 | — | එම | 6′ × 2′ |
| 244 | — | පිත්තල මුලු තහඩු | |
| 280 | — | පිත්තල පැති තහඩු | |

සියලුම ඉල්ලුම් පත්‍ර සීල් තබා ලියුම් කවරයෙහි මුදුන් වම් කෙළවරෙහි "වෝනෝ වශීයේ ඒකාබද්ධ කොයිල් ස්ප්‍රිං පට්ටම් කණ්නාඩි ආදිය සැපයීම සඳහා ඉල්ලුම් පත්‍ර" යන්න ලියා කොළඹ බන්ධනාගාර කර්මාන්ත අංශයේ අධිකාරි වෙත එවිය යුතුයි. ලිපි හිමි අයගේ නම සහ ලිපිනය ලියුම් කවරයේ පහත වම් කෙළවරෙහි සඳහන් කළ යුතුයි. මිළ ගණන් ඇතුළත් ඉල්ලුම් පත්‍ර රෙජිස්ටර් තැපැලෙන් එවිය හැක. නැතහොත් ඉල්ලුම්කරු හෝ ඔහුගේ නියෝජිතයෙකු විසින් පහත අත්සන් කරන අයගේ කායඝීලයට භාරදී කුවිතාන්සියක් ලබාගත යුතුයි.

1959 ජනවාරි මස 20 වැනි අඟහරුවාදා පෙරවරු 10 ට පහත අත්සන් කරන ලද අයගේ කායඝීලයේදී ඉල්ලුම් පත්‍ර විවෘත කරනු ලැබේ. ඉල්ලුම්කරුවන් කැමැති නම් ඉල්ලුම් පත්‍ර විවෘත කරන අවසථාවේදී එහි පෙනී සිටිය හැක.

ඉල්ලුම්කරුවන් විසින් තම ඉල්ලුම් පත්‍රයෙහි සඳහන් කරන මිළ ගණන් ඉල්ලුම් පත්‍ර භාර ගැනීමේ අවසාන දිනයේ සිට සති 6 ක කාලපරිච්ඡේදයක් ඉක්මෙන තුරු වලංගුවන බව සැළකිය යුතුයි. ඊයම් ඉල්ලුම් පත්‍රයක් පිළිගත් බැව් දන්වූ විට ඉල්ලුම්කරු එය පැහැර හැරියොත් ඔහු වැඩ පැහැර හරින ලද රජයේ කොන්ත්‍රාත් කරුවන්ගේ ලේඛනයට ඇතුළත් කොට රජයේ කිසිම කොන්ත්‍රාත් ආදියක් ලබා ගැනීමට ඉඩ නො සැළැස්විය හැකියි.

යම්කිසි ඉල්ලුම් පත්‍රයක් හෝ සියලුම ඉල්ලුම් පත්‍ර ප්‍රතික්ෂේප කිරීමේත්, ඉල්ලුම් පත්‍රයක යම්කිසි කොටසක් පිළි ගැනීමේත් බලය බන්ධනාගාර කර්මාන්ත අංශයේ අධිකාරි සතුය.

වැඩි විස්තර සඳහා පහත අත්සන් කරන අයගෙන් විමසිය යුතුයි.

ජේ. ඒ. පෙරුමාල්,
බන්ධනාගාර කර්මාන්ත අංශයේ අධිකාරි.

1959 ජනවාරි මස 6 වැනිදා,
කොළඹ 9,
බන්ධනාගාර මූලස්ථානයේ දී ය.

---

## ග්‍රාම සංවර්ධන සහ ගෘහ කර්මාන්ත දෙපාර්තමේන්තුව

කටුකැලේ බහිරවකන්දේ පෙෂකර්මාන්ත පාසලක් ඉදි කිරීම සඳහා සවදේශ කටයුතු භාර අමාත්‍යාංශයේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති මහතා විසින් 1959 ජනවාරි මස 30 වැනි දින පෙරවරු 10.30 දක්වා ටෙන්ඩර් පත්‍ර බාර ගනු ලැබේ. ටෙන්ඩර් (ආකෘති) පත්‍ර ලබා ගැනීම සඳහා රුපියල් 50 ඇප මුදලක් තැන්පත් කළ යුතු ය.

ජී. වී. පී. සමරසිංහ,
ග්‍රාම සංවර්ධන සහ ගෘහ කර්මාන්ත
අධ්‍යක්ෂක තැන.

1959 ජනවාරි මස 6 වන දින,
කොළඹ 7,
ටොරිංටන් චතුරශ්‍රයේදී ය.

---

## පළාත් පාලන දෙපාර්තමේන්තුව

### ජලය සැපයීමේ යෝජනා ක්‍රමය—අරාලි උතුර

යාපනය දිස්ත්‍රික්කයේ වඩුක්කොඩෙයි ගම්කායඝී සභාවේ අරාලි උතුරට නල මගින් ජලය සැපයීමේ යෝජනා ක්‍රමයක් ඇති කිරීම සඳහා කොල්ලුපිටියේ ටරව් පාරේ අංක 135 දරණ සථානයේ පිහිටි පළාත් පාලන සහ සංස්කෘතික කටයුතු පිළිබඳ අමාත්‍යාංශයේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති විසින් මුද්‍රාතැබූ ද්විත්ව ටැන්ඩර් ඉල්ලුම් පත්‍ර 1959යේ පෙබරවාරි මස 7 ශවනි සෙනසුරාදා උදෙ 9.30 දක්වා භාරගනු ලැබේ.

2. කොළඹින් පිටත ඕනෑම කච්චේරියක හෝ කොළඹ පරණ මහා ලේකම් කායඝීලයේ අංක 267 දරණ කාමරයේ පළාත් පාලන දෙපාතීමේන්තුවේ හෝ රුපියල් 100ක මුදලක් තැන්පත් කොට එයට ලැබෙන රිසිට්ටුව ඉදිරිපත් කිරීමෙන් කොළඹ නෙලුම්පොකුණ පාරේ අංක 54 දරණ සථානයේ පිහිටි ජල කර්මාන්තයේ ඉංජිනේරු මහතාගෙන් ඉල්ලුම් කිරීමෙන් ලබාගත් ආකෘති පත්‍රයක ටෙන්ඩරය ඉදිරිපත් කළ යුතුයි.

3. ආණ්ඩුවේ දෙපාර්තමේන්තුවල ජල කර්මාන්තය සහ කාණු දැමීමේ කොන්ත්‍රාත්කරුවන් වශයෙන් ද, කොළඹ නාගරික සභාවේ රුපියල් 50,000කට වඩා තක්සේරු කර ඇති වැඩ සම්බන්ධයෙන් ලියාපදිංචි වූවන්ට 1959 යේ ජනවාරි මස 31 වැනි සෙනසුරාදා උදේ 10ට ටෙන්ඩර් ආකෘති පත්‍ර නිකුත් කරනවා ඇත. ඉදින් දේශීය කොන්ත්‍රාත් කරුවන් ලියාපදිංචි කළ කවරයක ඔවුන්ගේ ටෙන්ඩර් එවීමට අදහස් නොකරතොත් කවරයේ පිටපැත්තේ විශෙෂ වැඩයත්, ඔවුන්ගේ නම සහ ලියුම් ලැබෙන පිළිවෙලත් සඳහන් කොට ටෙන්ඩර්

භාරගැනීමේ බලයලත් නිලධාරියාවූ කොළඹ වරාය පාරේ අංක 135 දරණ ස්ථානයේ පලාත් පාලන සහ සංස්කෘතික කටයුතු පිළිබඳ දෙපාර්තමේන්තුවේ සහකාර ලේකම්වරයා වෙත ටෙන්ඩර්භාරදිය යුතුයි.

4. ටෙන්ඩර්කරුවෝ ඔවුන්ගේ ඉල්ලීම් ටෙන්ඩර් පත්‍ර භාරගැනීම අවසන් කළ දිනයේ පටන් සති හයක කාලයක් නැබිය යුත්තාහ.

5. ටෙන්ඩර් විවෘත කරන දිනයවූ 1959යේ පෙබරවාරි මස 7 වැනි දින උදේ 10ට ටෙන්ඩර් කරුවන්ට කොළඹ වරාය පාරේ අංක 135 දරණ ස්ථානයට පැමිණ සිටිය හැක. කළයුතු වැඩ සහ ඒ පිළිබඳ තොරතුරු විස්තර (ආණ්ඩුවේ නිවාඩු දින හැර) සියලුම සතියේ දවස්වල උදේ 9යේ සිට පස්වරු 1 දක්වාත් පලාත් පාලන දෙපාර්තමේන්තුවේ ජල කර්මාන්ත ඉංජිනේරු මහතාගෙන් ඉල්ලුම් කිරීමෙන් ලබාගත හැක.

ඊ. ඇෆ්. ඩයස් අබේසිංහ,
වැඩ බලන පලාත් පාලන කොමසාරිස් තැන.

---

## මැනුම් දෙපාර්තමේන්තුව

1. " ගිග් " වර්ගයේ කුඩ 150 සිට 200 දක්වා ගණනක් අළුත් වැඩියා කිරීම සඳහා එවන ටෙන්ඩර් පත්‍ර, 1959 පෙබරවාරි මස 7 වෙනි දින පෙරවරු 10 දක්වා පහත සඳහන් ලිපිනයට භාරගනු ලැබේ. :—

සර්වේයර් ජනරාල්,
ගබඩා අංශය,
තැ. පෙ. 506,
කොළඹ.

කොළඹ වැනැම් වීදියේ පිහිටි සර්වේයර් ජනරාල් කාර්යාලයේ ගබඩා අංශයේදී " ගිග් " වර්ගයේ සැම්පල් කුඩයක් ලබාගත හැක.

2. සර්වේයර් ජනරාල් කාර්යාලයේ, ගබඩා අංශයෙන් ලබාගත හැකි ආකෘතිපත්‍රල පිළියෙල කරගත් ටෙන්ඩර් පත්‍ර (අනුපිටපතකුත් සමග) එවිය යුතුයි.

3. රුපියල් 50ක් ටෙන්ඩර් තැන්පත් මුදල වශයෙන්, තැන්පත් සළුවිට, 1959 පෙබරවාරි මස 5 වෙනි දින මධ්‍යාහ්නය දක්වා ටෙන්ඩර් පත්‍ර ලබා ගැනීමට පුළුවන.

4. වැඩි විස්තර සර්වේයර් ජනරාල් කාර්යාලයේ ගබඩා අංශයෙන් ලබාගත හැක.

වී. රාසරත්නම්,
සර්වේයර් ජනරාල්.

1959 ජනවාරි මස 3 දින,
කොළඹදීය.

---

අංකය : ඇල්. බී. 6805.

## කටුනායක තෝර්න්වුඩ් වත්තෙහි තිබෙන වැව්ලිවලින් උපදින දේ භුක්තිවිඳීමේ අයිතිවාසිකම බදු ගැනීම පිළිබඳ ටෙන්ඩර්

කටුනායක තිබෙන තෝර්න්වුඩ් වත්තෙහි අංක ඒ 3,215 දරණ මූලික සැලැස්මේ අංක එක සහ දෙක දරණ කට්ටිවල වැව්ලි වලින් ලැබෙන ඵලදාව භුක්තිවිඳීමේ අයිතිය එකී 1959ක්වූ පෙබරවාරි 1 වැනි දින සිට 1961 ජනවාරි 31 වැනිදට අවසන් වන දෑවුරුද්දට බදුකර යක් වශයෙන් පවරාදීම සඳහා කොළඹ දිස්ත්‍රික්කයේ දිසාපතිතුමා (මෙහි පහත දිසාපති යයි කියනු ලබන) විසින් පහත සඳහන් කොන්දේසිවලට අනුකූලව ටෙන්ඩර් පත්‍ර භාරගන්නා බැව් දන්වා සිටිනු ලැබේ.

2. 1959 ජනවාරි 23 වැනි දින පෙරවරු 11 වනතුරු කොළඹ කච්චේරියේදී ටෙන්ඩර් භාරගනු ලැබේ. ටෙන්ඩරය බහාලනු ලද කවරයේ වම් කෙළවරේ "කටුනායක තෝර්න්වුඩ් වත්තේ ඵලදාව බදු ගැන්ම සඳහා ටෙන්ඩරය" යැයි ලිවිය යුතුයි.

### කොන්දේසි

(1) සෑම ටෙන්ඩරයක්ම ලිවිය යුත්තේ කොළඹ කච්චේරියේ ඉඩම් පිළිබඳ ශාඛාවෙන් ලබාගත හැකි ආකෘති පත්‍රවලය.

(2) ටෙන්ඩර් සඳහා ආකෘති පත්‍රයක් ලබාගැනීමට පෙර කොළඹ කච්චේරියේ රු. 25ක මුදලක් තැන්පත්කොට ඒ සඳහා ලබාගත් කුවිතාන්සිය ඉදිරිපත් කළ යුතුයි.

(3) ටෙන්ඩර්කරු (මෙහි පහත බදු ගැනුම්කරු යයි කියනු ලබන) ඔහුගේ ටෙන්ඩරය බාරගතහොත් ඉන්පසු තුන් මසක බදු මුදලක් ඇපයක් වශයෙන් වහාම තැන්පත් කළ යුතුයි. මේ තැන්පත් කළ මුදල බද්ද අවසාන වීමෙන් පසු හෝ අවසන් කිරීමෙන් පසු ලබාගත හැක.

(4) ටෙන්ඩරය භාරගනු ලද බදු ගැනුම්කරු දිසාපතිතුමාගේ නියමයේ සිට දින 10ක් ඇතුලත බදු පොරොන්දු පත්‍රයකට අත්සන් තැබිය යුතුයි. එසේ නොකළහොත් හෝ ටෙන්ඩර් බාරගැනීමේ කොන්දේසි උල්ලංඝනය කළහොත් තැන්පත් කළ මුදල රජය සතු කරනු ඇත.

(5) බදු ගැනුම්කරු විසින් අත්සන් තැබිය යුතු බදු ඔප්පුවේ සෙසු කොන්දේසි වලට අමතරව පහත දක්වෙන කොන්දේසිද ඇතුලත්ව ඇත :—

(අ) මේ බද්ද වෙනුවෙන් ගෙවිය යුතු වරිපනම් සහ අයබදු ආදියක් වේනොත් ඒ සියල්ලම බදු ගැනුම්කරු විසින් ගෙවිය යුතුයි.

(ආ) මුළු බදු මුදලින් තෙමසකට සැසඳෙන මුදල් ඒ ගෙවන තෙමසෙහි පළමුවැනි දින හෝ පෙර කොළඹ කච්චේරියේදී ගෙවා සිටිය යුතුය.

(ඇ) දිසාපතිතුමාගේ ලියනලද අවසරයක් කල් තියා ලබා නො ගෙන බදු ගැනුම්කරු මේ බදු ඔප්පුව යටතේ තමාට තිබෙන අයිතිවාසිකම වෙන කෙනෙකුට දීම හෝ පැවරීම හෝ අතුරු බද්දක් වශයෙන් දීම හෝ වෙන අන්දමකින් අයිතිවාසි කමට යමක් කිරීම නොකට යුතුය.

(ඈ) බදු ගැනුම්කරු විසින් කපා හෙලීම යනාදී වශයෙන් කිසියම් අනතුරක් ගස්වලට කිරීම හෝ ඉම්කනු වෙනස් කිරීමක් හෝ වැටක් අගලක් හෝ කිසියම් විදියකින් වෙනස් නො කළ යුතුය.

(ඉ) බදු ගැනුම්කරු විසින් මේ ඉඩමෙන් වැලි හෝ බොරළු හෝ පස් ගල් හෝ නොගත යුතුය.

(ඊ) බදු ගැනුම්කරු මුරකරුගේ පැළ සහ ඉම්වැට යථා තත්වයෙන් තබා ගැනීම ගැන වග කිව යුතුය.

(උ) දිසාපතිතුමාගෙන් ලියනලද අවසරයක් නොමැතිව තාවකාලික හෝ ස්ථිර ගොඩනැගිල්ලක් ඉදි නොකළ යුතුය.

(ඌ) බදුගැනුම්කරු වත්ත යථා ප්‍රකාර පිරිසිදුව තබාගැනීම ගැන වග කිව යුතුය.

(ඍ) බද්ද අවසානවීමට පෙර මේ ඉඩම සම්පූර්ණයෙන් හෝ ඉන් කොටසක් දිසාපති තුමාට අවශ්‍ය වුවහොත් ඒ අවශ්‍ය ප්‍රමාණය ලියා එවන ලද මසක දැන්වීමක ඇවෑමෙන් ඔහුට බාරදිය යුතුය. එසේ භාරදීමට සිදු වුවහොත් අවසන් නොවූ කාලසීමාවට සැසඳෙන බදු මුදල බදු ගැනුම්කරුට ආපසු ගෙවනු ලැබේ.

(ඎ) බදු ඔප්පුවේ සඳහන් කොන්දේසි උල්ලංඝනය කළහොත් දිසාපතිතුමාට කිසිම වන්දියක් නොදී බදු අයිතිය ආපසු ගැනීමටත් තැන්පත් කළ මුදල රජය සතු කිරීමටත් බලය ඇත.

(ඏ) දිසාපතිතුමාගේ හෝ කර්මාන්ත පිළිබඳ අධ්‍යක්ෂකතුමාගේ හෝ ඔවුන්ගේ නියෝජිතයින්ගේ පරීක්ෂණය සඳහා මේ වත්ත සැම විටම විවෘතව තිබිය යුතුය.

(ඐ) කර්මාන්ත දෙපාර්තමේන්තුවේ නිලධාරීන්ගේ පරීක්ෂණ කටයුතුවලට කිසිම බාධකයක් නොවන බවට බදු ගැනුම්කරු වගකිව යුතුය.

(අඅ) බද්දෙහි අවසානයට පෙර බද්දෙන් නිදහස් වීමට කැමැත්තේ නම් බදු ගැනුම්කරු විසින් යටත් පිරිසෙයින් තෙමසක ලියන ලද දැන්වීමක් දිසාපතිතුමා වෙත කළ යුතුය.

(ආආ) මේ බද්ද පිළිබඳ ටෙන්ඩර් බාරගැනීමේ හෝ නොගැනීමේ බලය දිසාපතිතුමා සතුය.

සී. ආර්. ද සිල්වා,
දිසාපතිතුමා වෙනුවට.

1959 ජනවාරි මස 1 වැනි දින,
කොළඹ කච්චේරියේදීය.

---

පහත සඳහන් උප ලේඛනයෙහි දක්වෙන රත්නපුර දිස්ත්‍රික්කයේ නැනීමට යෝජිත වාරි කර්මාන්තයන් සඳහා ටෙන්ඩර් ඉල්ලුම් පත්‍ර, එකී 1959 ක්වූ ජනවාරි මස 29 වැනි ගුරු දින පෙරවරු 9.30 තෙක් මවිසින් ලියා පදිංචි කරන ලද කොන්ත්‍රාත් කරුවන්ගෙන් සහ ග්‍රාම සංවර්ධන සමිතිවලින්ද භාර ගනු ලැබේ.

2. ටෙන්ඩර් ඉල්ලුම් පත්‍ර ලියා පදිංචි කරන ලද තැපැලෙන් එවීමට අදහස් නොකරන කොන්ත්‍රාත් කරුවනට ඔවුන්ගේ ටෙන්ඩර් ඉල්ලුම් පත්‍ර අතින්ම හෝ ඔවුන්ගේ නියෝජිතයන්ගේ අතින්ම හෝ මගේ කායාලයීය සහකාර තැනට භාර දිය හැක.

3. ටෙන්ඩර් ඉල්ලුම් පත්‍ර සීල් තබා පිට කවරයේ ටෙන්ඩර් ඉල්ලුම් කරන වැඩය සඳහන් කිරීමට හා තමාගේ නම හා ලිපිනය එහි සඳහන් කිරීමට අමතක නොකළ යුත්තේ ඒ විස්තර සඳහන් කිරීම අත්‍යාවශ්‍ය හෙයිනි.

4. එක් එක් වැඩය සඳහා ටෙන්ඩර් ඉල්ලුම් පත්‍ර දෙක බැගින් එවිය යුතු වේ. ටෙන්ඩර් ඉල්ලුම් පත්‍රවල දෙවැනි පිටපත් පරීක්ෂාකර බැලීම අවශ්‍යයයි හැඟෙතොත් ටෙන්ටර් මණ්ඩලයේ සභාපති සමග සාකච්ඡාකර ඒ සඳහා අවශ්‍ය විධි විධාන සළස්වා ගත හැක.

5. ටෙන්ඩර් ඉල්ලුම් පත්‍ර ගැන සළකා බැලීමට එදිනම පෙරවරු 10 ට කොන්ත්‍රාත්කරුවන් ඉදිරියෙහි දීම ඒවා විවෘත කරනු ලබන හෙයින් කොන්ත්‍රාත්කරුවෝ එදින නියමිත වේලාවට මෙම කච්චේරියේ ටෙන්ඩර් මණ්ඩලය ඉදිරියේ පෙනී සිටිය යුත්තෝය.

6. වැඩි විස්තර හා ආකෘති පත්‍ර 1959 ක්වූ ජනවාරි මස 28 වැනි දින දහවල් 12 දක්වා මගෙන් ලබා ගත හැක.

7. ටෙන්ඩර් ඉල්ලුම් පත්‍ර ඉදිරිපත් කිරීමේදී පළමුව තමා ඉල්ලුම් කරන වැඩය ගැන තමාම සියලු විස්තර පරීක්ෂාකර බලා ගත් බැව් ඉල්ලීම් ගැන සැළකීමේදී හඟිනු ලැබේ.

## උප ලේඛනය

| | කටයුත්ත (වැඩය) | පිහිටීම | | කෝරළ |
|---|---|---|---|---|
| 1. | හල්දොළ අමුන අලුත් වැඩියා කිරීම | හුණුවල | ... | කඩවත හා මැද |
| 2. | බඹරබොටුකන්ද මහ ඇළ දියුණු කිරීම | බඹරබොටුකන්ද | | එම |
| 3. | උතුමන් ඇළ දියුණු කිරීම ... | ඇල්ලෙපොල ... | | එම |
| 4. | හුණුවල මහ අමුණ අලුත්වැඩියා කිරීම | හුණුවල | ... | එම |
| 5. | කොස්කොටේ අමුණ අලුත් වැඩියා කිරීම | ඌරාවල | ... | එම |
| 6. | ගුරුමැටියේ ඇළ—කරවුගැටන අලුත් වැඩියා කිරීම | මැද්දෙගම | ... | එම |
| 7. | අරාවේගොඩ වෙල්යායේ වේල්ල දියුණුකිරීම | වෙළහ | ... | එම |
| 8. | කටුගස්ඇළේ අමුණ දියුණු කිරීම | කටුගස්ඇළ | ... | කුරුවිටි |
| 9. | පුවක්ගහදොළ අමුණ තැනීම... | ගොඩිගමුව | ... | එම |
| 10. | පොත්දෙනියේ අමුණ තැනීම | පලීගල | ... | එම |
| 11. | පෙත්තරදොළ අමුණ තැනීම... | නිවිතිගල | ... | නවදුන් |
| 12. | ගල්ලැල්ල අමුණ තැනීම ... | රිදීවිට | ... | අටකලන් |
| 13. | හත්තැලිදොළේ අමුණ අලුත් වැඩියා කිරීම | දිඹුල්වල | ... | එම |
| 14. | පූලෙ ගහවත්තේ අමුණ තැනීම | තඹගමුව | ... | එම |

එල්. බී. අබයරත්න,
රත්නපුර දිස්ත්‍රික්කයේ රජයේ දිසාපති.

රත්නපුර කච්චේරිය,
1959 ජනවාරි මස 1 වැනිද.

---

## ආණ්ඩුවේ වැඩ දෙපාර්තමේන්තුව

මහනුවරට සපයන ජලය පිරිසිදු කිරීමට උවමනා උපකරණ සඳහා එවන ටැන්ඩර් 1959 යේ ජනවාරි 31 වෙනිදා දවල් 12 වන තුරු භාර ගන්නා බව මෙයින් දන්වනු ලැබේ.

සී. රාසයියා,
ආණ්ඩුවේ වැඩ දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂක තුමා වෙනුවට.

ආණ්ඩුවේ වැඩ දෙපාර්තමේන්තුව,
කොළඹ, 59. 1. 6.

---

## ආණ්ඩුවේ වැඩ දෙපාර්තමේන්තුව

දකුණු කොළඹ නගරවලට සපයන ජලය පිරිසිදු කිරීමට උවමනා කරණ උපකරණ සඳහා එවන ටැන්ඩර් පත්‍ර 1959 යේ ජනවාරි 17 වෙනි සෙනසුරාදා දවල් 12 වන තෙක් භාර ගනු ලබන බව මෙයින් දන්වනු ලැබේ.

සී. රාසයියා,
ආණ්ඩුවේ වැඩ දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂක තුමා වෙනුවට

ආණ්ඩුවේ වැඩ දෙපාර්තමේන්තුව,
කොළඹ, 59.1.6.

කොළඹ ඇල්ලින් චතුරශ්‍රයේ කොම්පැනි රෙජිස්ත්‍රාත් තැනගේ කාර්යාලය, අළුත් වැඩියා කිරීම සඳහා එවන ටෙන්ඩර් පත්‍ර කොළඹ ආණ්ඩුවේ වැඩ දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්යාලයෙහි වූ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති තැන විසින් වර්‍ෂ 1959 යේ ජනවාරි මස 28 වෙනි බදාදා පෙරවරු 10.30 වන තෙක් භාර ගනු ලැබේ. ටෙන්ඩර් පත්‍ර විවෘත කරන එකී වේලාවේදී (බදාදා පෙරවරු 10.30ට) ටෙන්ඩර් කරුවන්ට එතැනට පැමිණ සිටිය හැකිය.

2. කොළඹ, ටොරිංටන් චතුරශ්‍රයේ ආ. වැ. දෙපාර්තමේන්තුවේ කොළඹ බස්නාහිර කොටස භාර ගොඩනැගිලි පිළිබඳ විධායක ඉංජිනේරු තැනගෙන් පෝරම කොළ ලබාගෙන ටෙන්ඩර් පත්‍ර ලියා අනු පිටපතක්ද සහිතව එවිය යුතුයි. මේ සම්බන්ධ සියලු විස්තර හා තොරතුරු ඔහුගෙන් ලබා ගත හැකිය. සැලැස්මවල්ද ඔහුගේ කාර්යාලයේදී බලා ගැනීමට පුළුවන.

3. වර්‍ෂ 1959 යේ ජනවාරි මස 23 වෙනි සිකුරාදා පස්වරු 4.30 වන තෙක් ආ. වැ. දෙපාර්තමේන්තුවේ ගොඩනැගිලි වැඩ සඳහා රුපියල් 6000 ට, නොඅඩු ගණනකට ලියා පදිංචි වූ කොන්ත්‍රාත් කරුවන්ට පමණක් ඉහත සඳහන් ඉංජිනේරු තැනට (අ) තමන්ගේ ලියා පදිංචිය පිළිබඳ ලියකියවිලි සහ (ආ) ටෙන්ඩර් තැන්පත් මුදල වන රු. 25ක් තැන්පත් කර ලබා ගත් කුවිතාන්සිය ඉදිරිපත් කළ විට, මේ සඳහා ටෙන්ඩර් පත්‍ර එවිය හැකිය.

4. ටෙන්ඩර් සඳහා තැන්පත් කළයුතු මුදල කොළඹ කොටුවේ පිහිටි ආ. වැ. දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කායඹාලයෙහි හෝ කොළඹින් පිටත ඕනෑම කච්චේරියක හෝ තැන්පත් කළ හැකිය.

වී. ඊ. හේරත්,
ආණ්ඩුවේ වැඩ දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂක වෙනුවට ය.

කොළඹ, ආණ්ඩුවේ වැඩ දෙපාර්තමේන්තුවේ
කාර්යාලයේදිය, 59.1.6.

---

ගාල්ලේ විවාහක උප පොලිස් ඉන්ස්පැක්ටර්වරුන්ට නිවාස සයක් සෑදීම සඳහා එවන ටෙන්ඩර් පත්‍ර කොළඹ 1, ට්‍රාන්ස්වර්ක්ස් හවුස් හී පිහිටි ප්‍රවාහණ සහ රජයේ වැඩ පිළිබඳ අමාත්‍යාංශයෙහි වූ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති තැන විසින් වර්‍ෂ 1959 පෙබරවාරි මස 11 වෙනි බදාදා පෙරවරු 9.30 වන තෙක් භාර ගනු ලැබේ. ටෙන්ඩර් පත්‍ර විවෘත කිරීමට නියමිත වේලාව වන මෙදින පස්වරු 2.30 ට ටෙන්ඩර් කරුවන්ට එතැනට පැමිණ සිටිය හැකිය.

2. ගාල්ලේ ආ. වැ. දෙපාර්මේන්තුවේ විධායක ඉංජිනේරු තැනගෙන් පෝර්ම කොළ ලබා ගෙන ටෙන්ඩර් පත්‍ර ලියා අනු පිටපතක්ද සහිතව එවිය යුතුයි. මේ සම්බන්ධව සියලු විස්තර හා තොරතුරු ඔහුගෙන් ලබා ගත හැකිය. සැලැස්මවල්ද ඔහුගේ කාර්යාලයේදී බලා ගැනීමට පුළුවන.

3. වර්‍ෂ 1959 යේ ජනවාරි මස 23 වෙනි සිකුරාදා පස්වරු 4.30 වන තෙක් ආ. වැ. දෙපාර්තමේන්තුවේ ගොඩනැගිලි වැඩ සඳහා රුපියල් 2,16,000ට නොඅඩු ගණනකට ලියා පදිංචි වූ කොන්ත්‍රාත්කරුවන්ට පමණක් ඉහත සඳහන් ඉංජිනේරු තැනට (අ) තමන්ගේ ලියා පදිංචිය පිළිබඳ ලියකියවිලි සහ (ආ) ටෙන්ඩර් තැන්පත් මුදල වන රු. 200ක් තැන්පත් කර ලබා ගත් කුවිතාන්සිය ඉදිරිපත් කළ විට, මේ සඳහා ටෙන්ඩර් පත්‍ර එවිය හැකිය.

4. ටෙන්ඩර් සඳහා තැන්පත් කළයුතු මුදල කොළඹ කොටුවේ පිහිටි ආ. වැ. දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කායඹාලයෙහි හෝ කොළඹින් පිටත ඕනෑම කච්චේරියක හෝ තැන්පත් කළ හැකිය.

වී. ඊ. හේරත්,
ආණ්ඩුවේ වැඩ දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂක වෙනුවට.

කොළඹ, ආණ්ඩුවේ වැඩ දෙපාර්තමේන්තුවේ
කාර්යාලයේදිය. 59.1.6.

---

වව්නියාවේ ආහාර ගබඩාවේ කායඹාලයක්, වැසිකිලි කණ්ඩායක් ආදිය සෑදීම සඳහා එවන ටෙන්ඩර් පත්‍ර කොළඹ ආණ්ඩුවේ වැඩ දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්යාලයෙහි වූ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති තැන විසින් වර්‍ෂ 1959 යේ ජනවාරි මස 28 වෙනි බදාදා පෙරවරු 10.30 වන තෙක් භාර ගනු ලැබේ. ටෙන්ඩර් පත්‍ර විවෘත කරන එකී වේලාවේදී (බදාදා පෙරවරු 10.30ට) ටෙන්ඩර්කරුවන්ට පැමිණ සිටිය හැකිය.

2. වව්නියාවේ ආ. වැ. දෙපාර්තමේන්තුවේ විධායක ඉංජිනේරු තැනගෙන් පෝරම කොළ ලබාගෙන ටෙන්ඩර් පත්‍ර ලියා අනු පිටපතක්ද සහිතව එවිය යුතුයි. මේ සම්බන්ධ සියලු විස්තර හා තොරතුරු ඔහුගෙන් ලබා ගත හැකිය. සැලැස්මවල්ද ඔහුගේ කාර්යාලයේදී බලා ගැනීමට පුළුවන.

3. වර්‍ෂ 1959 යේ ජනවාරි මස 23 වෙනි සිකුරාද පස්වරු 4.30 වන තෙක් ආ. වැ. දෙපාර්තමේන්තුවේ ගොඩනැගිලි වැඩ සඳහා රුපියල් 10,000ට නොඅඩු ගණනකට ලියා පදිංචි වූ කොන්ත්‍රාත් කරුවන්ට පමණක් ඉහත සඳහන් ඉංජිනේරු තැනට (අ) තමන්ගේ ලියා පදිංචිය පිළිබඳ ලියකියවිලි සහ (ආ) ටෙන්ඩර් තැන්පත් මුදල වන රු. 25ක් තැන්පත් කර ලබා ගත් කුවිතාන්සිය ඉදිරිපත් කළ විට, මේ සඳහා ටෙන්ඩර් පත්‍ර එවිය හැකිය.

4. ටෙන්ඩර් සඳහා තැන්පත් කළයුතු මුදල කොළඹ කොටුවේ පිහිටි ආ. වැ. දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කායර්‍යාලයෙහි හෝ කොළඹින් පිටත ඕනෑම කච්චේරියක හෝ තැන්පත් කළ හැකිය.

වී. ඊ. හේරත්,
ආණ්ඩුවේ වැඩ දෙපාර්තමේන්තුවේ අධ්‍යක්‍ෂක
වෙනුවට ය.

කොළඹ, ආණ්ඩුවේ වැඩ දෙපාර්තමේන්තුවේ
කාර්යාලයේ දීය, 59.1.6.

---

පොලොන්නරුවේ පොලිසි ගොඩනැගිලිවලට ජලය සැපයීම සඳහා එවන ටෙන්ඩර් පත්‍ර කොළඹ ආණ්ඩුවේ වැඩ දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්යාලයෙහි වූ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති තැන විසින් වර්‍ෂ 1959 යේ ජනවාරි මස 28 වෙනි බදාදා පෙරවරු 10.30 වන තෙක් භාර ගනු ලැබේ. ටෙන්ඩර් ප විවෘත කරන එකී වේලාවේදී (බදාදා පෙරවරු 10.30ට) ටෙනාඩර්කරුවන්ට එතැනට පැමිණ සිටිය හැකිය.

2. පොලොන්නරුවේ ආ. වැ. දෙපාර්තමේන්තුවේ විධායක ඉංජිනේරු තැනගෙන් පෝරම කොළ ලබාගෙන ටෙන්ඩර් පත්‍ර ලියා අනු පිටපතක් ද සහිතව එවිය යුතුයි මේ සම්බන්ධ සියලු විස්තර හා තොරතුරු ඔහුගෙන් ලබා ගත හැකිය. සැලැස්මවල් ද ඔහුගේ කාර්යාලයේදී බලා ගැනීමට පුළුවන.

3. වර්‍ෂ 1959 යේ ජනවාරි මස 23 වෙනි සිකුරාද පස්වරු 4.30 වන තෙක් ආ. වැ. දෙපාර්තමේන්තුවේ ගොඩනැගිලි වැඩ සඳහා රුපියල් 15,000ට නොඅඩු ගණනකට ලියා පදිංචි වූ කොන්ත්‍රාත් කරුවන්ට පමණක් ඉහත සඳහන් ඉංජිනේරු තැනට (අ) තමන්ගේ ලියා පදිංචිය පිළිබඳ ලියකියවිලි සහ (ආ) ටෙන්ඩර් තැන්පත් මුදල වන රු. 25 ක් තැන්පත් කර ලබා ගත් කුවිතාන්සිය ඉදිරිපත් කළ විට, මේ සඳහා ටෙන්ඩර් පත්‍ර එවිය හැකිය.

4. ටෙන්ඩර් සඳහා තැන්පත් කළයුතු මුදල කොළඹ කොටුවේ පිහිටි ආ. වැ. දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කායර්‍යාලයෙහි හෝ කොළඹින් පිටත ඕනෑම කච්චේරියක හෝ තැන්පත් කළ හැකිය.

වී. ඊ. හේරත්,
ආණ්ඩුවේ වැඩ දෙපාර්තමේන්තුවේ අධ්‍යක්‍ෂක
වෙනුවට ය.

කොළඹ, ආණ්ඩුවේ වැඩ දෙපාර්තමේන්තුවේ
කායර්‍යාලයේ දීය, 59.1.6.

---

ගලෙන් බිඳුනු වැවේ පොලිස් ගොඩනැගිල්ල අළුත් වැඩියා කිරීම සඳහා එවන ටෙන්ඩර් පත්‍ර කොළඹ ආණ්ඩුවේ වැඩ දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්යාලයෙහි වූ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති තැන විසින් වර්‍ෂ 1959 යේ ජනවාරි මස 28 වෙනි බදාදා පෙරවරු 10.30 වන තෙක් භාර ගනු ලැබේ. ටෙන්ඩර් පත්‍ර විවෘත කරන එකී වේලාවේදී (බදාදා පෙරවරු 10.30ට) ටෙන්ඩර් කරුවන්ට එතැනට පැමිණ සිටිය හැකිය.

2. මරදන්කඩවල ආ. වැ. දෙපාර්තමේන්තුවේ විධායක ඉංජිනේරු තැනගෙන් පෝරම කොළ ලබාගෙන ටෙන්ඩර් පත්‍ර ලියා අනු පිටපතක් ද සහිතව එවිය යුතුයි. මේ සම්බන්ධ සියලු විස්තර හා තොරතුරු ඔහුගෙන් ලබා ගත හැකිය. සැලැස්මවල් ද ඔහුගේ කාර්යාලයේදී බලා ගැනීමට පුළුවන.

3. වර්‍ෂ 1959 යේ ජනවාරි මස 23 වෙනි සිකුරාද පස්වරු 4.30 වන තෙක් ආ. වැ. දෙපාර්තමේන්තුවේ ගොඩනැගිලි වැඩ සඳහා රුපියල් 5,000ට, නොඅඩු ගණනකට ලියා පදිංචි වූ කොන්ත්‍රාත් කරුවන්ට පමණක් ඉහත සඳහන් ඉංජිනේරු තැනට (අ) තමන්ගේ ලියා පදිංචිය පිළිබඳ ලියකියවිලි සහ (ආ) ටෙන්ඩර් තැන්පත් මුදල වන රු. 25ක් තැන්පත් කර ලබා ගත් කුවිතාන්සිය ඉදිරිපත් කළ විට, මේ සඳහා ටෙන්ඩර් පත්‍ර එවිය හැකිය.

4. ටෙන්ඩර් සඳහා තැන්පත් කළ යුතු මුදල කොළඹ කොටුවේ පිහිටි ආ. වැ. දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්යාලයෙහි හෝ කොළඹින් පිටත ඕනෑම කච්චේරියක හෝ තැන්පත් කළ හැකිය.

වී. ඊ. හේරත්,
ආණ්ඩුවේ වැඩ දෙපාර්තමේන්තුවේ අධ්‍යක්‍ෂක
වෙනුවට ය.

කොළඹ, ආණ්ඩුවේ වැඩ දෙපාර්තමේන්තුවේ
කාර්යාලයේ දීය, 59.1.6.

---

# තීරණය කළ ටැන්ඩර් පත් පිළිබඳ දැන්වීම්

## වාරිමාර්ග දෙපාර්තමේන්තුව

### ඇළුමිනියම් තහඩු ගොඩනැගිලි සැපයීම සඳහා ටෙන්ඩර් පත්‍ර කැඳවීම

### ටෙන්ඩර් අයදුම්පත් ප්‍රතිඵල

පහත සඳහන් සමාගම් මගින් ටෙන්ඩර් පත්‍ර ඉදිරිපත් කරන ලදි :—

(1) සීමාසහිත මෝරිස් රෝච් සමාගම, කොළඹ.
(2) සීමාසහිත ඇන්ග්ලෝ ඊජියන් සමාගම, කොළඹ.
(3) සීමාසහිත සැමුවල් සහ සමාගම, කොළඹ.
(4) සීමාසහිත රෝච් සහ රෝච් සමාගම, කොළඹ.
(5) සීමාසහිත ජිනසේන සහ සමාගම, කොළඹ.
(6) සීමාසහිත මැක්වුඩ් සමාගම, කොළඹ.
(7) සීමාසහිත යුනයිටඩ් ට්‍රැක්ටර් සහ එක්විප්මන්ට් සමාගම, කොළඹ.
(8) සීමාසහිත බූත් ට්‍රෙඩින් සමාගම, එක්සත් රාජධානිය. (ක්‍රවුන් ඒජන්ට්ස් මාර්ගයෙන් ඉදිරිපත් කරන ලදී).

ප්‍රතිඵල :

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| 1 | විෂය | සීමාසහිත මැක්වුඩ් සමාගම | ... | බඩු කොළඹට පැමිණි විට වටිනාකම ඉන්ෂුවරන්ස් සහ නැව් ගාස්තු ඇතුලුව | පවුම් | 11,130–0–0 |
| 2 | විෂය | එම | ... | එම ... | පවුම් | 1,953–7–0 |
| 3 | විෂය | එම | ... | එම ... | පවුම් | 5,193–9–0 |
| 4 | විෂය | සීමාසහිත බූත් ට්‍රෙඩිං සමාගම | ... | එම ... | පවුම් | 468–0–0 |
| 5 | විෂය | සීමාසහිත මැක්වුඩ් සමාගම | ... | එම ... | පවුම් | 656–0–0 |

1, 2, 3 සහ 5 යන විෂයන් සඳහා රජය විසින් මුදල් ගැනීමේ බලපත්‍ර (ලෙටර් ඔෆ් ක්‍රෙඩිට්) විවෘත කරනු ලැබේ.

වාරිමාර්ග දෙපාර්තමේන්තුව,
කොළඹ, 24.12.58.

බී. සෙල්ලහේවා,
වාරිමාර්ග අධ්‍යක්ෂ වෙනුවට.

### සෞඛ්‍ය සේවා අධිකාරි තැන—කළුතර

**ටෙන්ඩර් ප්‍රතිඵල—කිලිටි රෙදි සේදීම 1958-59 සහ 1958-60**

| ආයතනයේ නම | තෝරාගත් ටෙන්ඩර්කරුගේ නම | පිළිගත් ටෙන්ඩරයේ ගණන කෑල්ලකට රු. ශ. | මාසයකට වැඩිම ගණන රු. ශ. | අනිත් ටෙන්ඩර්කරුවන්ගේ නම |
|---|---|---|---|---|
| රජයේ රෝහල, කළුතර | ඇස්. ජී. ප්‍රනාන්දු මයා. | 0 08 | 960 0 | බී. ඇස්. ප්‍රනාන්දු මයා.<br>ආර්. ඇස්. ප්‍රනාන්දු මයා.<br>ඇස්. මර්තේලිස් මයා.<br>ඩබ්ලිව්. ඇම්. ප්‍රනාන්දු මයා.<br>ඇන්. කතෝනිස් මයා. |
| රජයේ රෝහල, පානදුර | ඇම්. විලියම මයා. | 0 08 | 500 0 | ඩබ්ලිව්. ඇම්. ප්‍රනාන්දු මයා.<br>ඇස්. ආර්. චාර්ලිස් මයා. |
| රජයේ රෝහල, හොරන | වයි. ඇස්. ඇස්. ප්‍රනාන්දු මයා. | 0 10 | 300 0 | — |
| රජයේ රෝහල, පිඹුර | ඇස්. ආර්. ප්‍රනාන්දු මිය. | 0 20 | 250 0 | ඩබ්ලිව්. වී. සිරිදියෙස් මයා.<br>ඇස්. නෝමිස් මයා. |
| රජයේ රෝහල, නෑබොඩ | ඇස්. ඩී. ප්‍රනාන්දු මයා | 0 06 | 80 0 | ඇස්. පී. ප්‍රනාන්දු මයා. |
| රජයේ රෝහල, ඉත්තාපාන | බී. එච්. සයිමන් මයා. | 0 19 | 80 0 | — |
| රජයේ රෝහල, මීගහතැන්න | ඇන්. ඇසිලින් මිය. | 0 07 | 40 0 | බී. එච්. ජේටින් මයා. |
| ග්‍රාමීය රෝහල, මතුගම | කේ. ආර්. ජේ. ප්‍රනාන්දු මයා. | 0 10 | 60 0 | — |
| ග්‍රාමීය රෝහල, අළුත්ගම | අයි. ඇස්. ප්‍රනාන්දු මයා. | 0 14 | 40 0 | — |
| ග්‍රාමීය රෝහල, අළුත්ගම්විදිය | අයි. ඇස්. ප්‍රනාන්දු මයා. | 0 10 | 35 0 | බී. එච්. ඩියෝනිස් මයා. |
| ග්‍රාමීය රෝහල, ගල්පාත | පී. ජේ. ප්‍රනාන්දු මයා. | 0 14 | 75 0 | ඇස්. එච්. මර්තේලිස් මයා. |
| මාතෘ නිවාසය, බන්ධාරගම | ආර්. ඇස්. ප්‍රනාන්දු මයා. | 0 15 | 40 0 | — |
| මාතෘ නිවාසය, බෙරුවල | ඩී. ඇම්. මානිස් මයා. | 0 20 | 75 0 | — |
| සෞඛ්‍ය කාර්යාලය සහ නේවාසිකාගාරය, කළුතර | ටී. ජෝමිස් මයා. | 0 14 | 70 0 | — |

සෞඛ්‍ය සේවා අධිකාරිය,
කළුතර, 5.1.59.

බී. කේ. ද සිල්වා,
සෞඛ්‍ය සේවා අධිකාරි.

---

### ටැන්ඩර් ප්‍රතිඵල——සුරාබද්ද කාර්යාංශය

| විස්තර | ටැන්ඩර් කරුවෝ | ප්‍රතිඵල |
|---|---|---|
| 1. අඩංගු දේ සොරකම් කළ නොහැකි හා සිදුරු කළ නොහැකි ක්‍රමයේ ඇබ ග්‍රොස් 62,000 ක් හා<br>2. ඇබ සවි කිරීමේ යන්ත්‍ර 12ක් සැපයීම සඳහා ටැන්ඩර් | 1. සීමාසහිත මැටල් ක්ලෝෂර්ස්, වෙස්ට් බ්‍රොම්විච්, ස්ටැෆ්ඩ්ෂයර්, එංගලන්තය<br>2. "ඩැනෙක්ස්" ඕගනයිසේෂන්, මිලානෝ (720), වියා අමාතෝරෙ ස්කියසා 5, ඉතාලිය | අංක 1 දරණ ටැන්ඩරය භාර ගන්නා ලදී |

සුරාබද්ද කොමසාරිස් තැනගේ කාර්යාලය,
කොළඹ 10, 1958 දෙසැම්බර් 17.

ටී. බී. වඩුගොඩපිටිය,
වැඩබලන සුරාබද්ද කොමසාරිස් තැන.

---

# විවිධ දැන්වීම්

### ජාතික නිවාස දෙපාර්තමේන්තුව

**නිවාස සඳහා ඉල්ලුම්පත්‍ර—කුරුණෑගල නිවාස යෝජනා ක්‍රමය**

කුරුණෑගල යන්තම්පලාවේ තනා තිබෙන කුලියට සින් කරවීමේ ක්‍රමයට දිය හැකි අඩු කුලී ගෙවල් තිස් හයක් සඳහා ජාතික නිවාස කොමසාරිස් තැන විසින් පහත සඳහන් සුදුසුකම් ඇති අයදුම්කරුවන්ගේ ඉල්ලුම් පත්‍ර භාරගනු ලැබේ :—

(අ) තමන්ගේ හා තමන්ගේ භාර්යාවගේ / ස්වාමිපුරුෂයාගේ මාසික ආදායම රුපියල් 200කට නොවැඩි අයගෙන් ;

(ආ) දැන්වීම පළවන දිනයට මාස 6කට නොඅඩු කාලයක් කුරුණෑගල නගර සභා ප්‍රදේශය ඇතුළත හෝ නිවාස යෝජනා ක්‍රමයේ සිට සැතපුම් 5ක අර්ධ විෂ්කම්භයක් ඇති ප්‍රදේශයක පදිංචිව හෝ රැකියාවෙහි යෙදී සිටි අය ;

(ඇ) පදිංචිය සඳහා තම අවශ්‍යතාවන් පිරිමැසෙන තරමේ ගෙයක් තමන්ගේ නමින් හෝ සිය භාර්යාවගේ නමින් හෝ නොමැති අය.

2. සෑම ගෙයක්ම පිහිටා ඇත්තේ දළ වශයෙන් පර්චස් 13ක් පමණවූ ඉඩමකය. ගෙවල් වල වහල උළු සෙවිලි කර ඇති අතර බිම සිමෙන්තියෙන් සාදා ඇත. එක ගෙයකට ඉස්තෝප්පුවක්, කාමර දෙකක්, මුළුතැන් ගෙයක් සහ ජල මුද්‍රිත වැසිකිළියක් බැගින් තිබේ. බීම පිණිස ජලය ළිං වලින් ලබාගත හැකි අතර නෑම පිණිස ගෙවල් කට්ටියකට එක බැගින් සුදුසු මධ්‍යස්ථානයන්හි නාන ළිං සැපයෙනවා ඇත.

3. අවුරුදු 25කින් මුළු මුදල ගෙවී යන පරිදි ගෙයක කුලිය මසකට රුපියල් 20ක් පමණ වේ.

4. ගෙයි පදිංචිකාරයාට ගෙයි නීත්‍යානුකූල අයිතිය පැවරෙන්නේ මුදල සම්පූර්ණයෙන්ම ගෙවා අවසන් කළ විටය. ගෙයි පදිංචිකාරයා යම්කිසි අවස්ථාවකදී ශෙෂව තිබෙන මුදල එක් විටම ගෙවා දැම්මත් සැමගම ගෙයි නීත්‍යානුකූල අයිතියක් ඔහුට පවරා දෙනු ලැබේ. ගෙයි පදිංචියට ගිය දා සිට පදිංචිකාරයා විසින්ම ගෙය නඩත්තු කළ යුතුවා පමණක් නොව, ගෙවල් කුලියද, වරිපණම්ද, හා වෙනත් ගාස්තුද ගෙවිය යුතු වේ.

5. ගෙවල් වල පදිංචිය සඳහා සුදුසු අය තෝරාගනු ලබන්නේ ජාතික නිවාස කොමසාරිස් වරයා විසිනි. මොනම අයථා පෙළඹීමක් ඇති වුවහොත් එයම ඉල්ලුම්කරුවකු නුසුදුස් සතු වීමට කාරණයක් වන්නේ ය.

6. 1959 පෙබරවාරි මස 28 දා තෙක් ඉල්ලුම් පත්‍ර භාරගනු ලැබේ. "ජාතික නිවාස කොමසාරිස් තැන ලංකා බැංකු ගොඩනැගිල්ල, කොළඹ" යන ලිපිනයට පහත සඳහන් කරුණු අඩංගු කොට තමන් විසින්ම පිළියෙල කරගත් ඉල්ලුම් පත් හෝ ජාතික නිවාස දෙපාර්තමේන්තුවෙන් ලබාගත හැකි ඉල්ලුම් පත්‍රවල පිළියෙල කොට එවිය

යුතුය. ඉල්ලුම් පත්‍ර එවා දින 14ක් තුළදී එය ලැබුණු බවට දැන්වීමක් නොලැබුණොත් ඒ බැව් දන්වා තැපැල් කාර්යාලයේ ලියාපදිංචි කරන ලද ලිපියකින් මෙම දෙපාර්තමේන්තුවට දැන්විය යුතුය. ඉල්ලුම් පත්‍ර බහා එවනු ලබන පිට කවරයේ වම් පැත්තේ ඉහළ කෙළවරේ " කුරුණෑගල නිවාස සඳහා ලේලුම් පත්‍ර " යැයි සඳහන් කළ යුතුය.

ආර්. ඇල්. ආර්නෝල්ඩ්,
ජාතික නිවාස කොමසාරිස් තැන.

1959 ජනවාරි මස 5 වැනි දින
කොළඹදීය.

## කුරුණෑගල යන්තම්පලාවේ අඩු කුලී නිවාසයන් සඳහා එවන ලබන ඉල්ලුම් පත්‍රවල අඩංගු විය යුතු කරුණු

1. (අ) සම්පූර්ණ නම :————.
(වාසගම පළමුව සඳහන් කරන්න)
(ආ) ලංකාවේ පුරවැසියෙක්ද යන බව :————.

2. දැනට පදිංචි ස්ථානයේ ලිපිනය සහ තත්ත්වය :————.

3. (අ) විවාහකද, නැද්ද යන බව :————.
(ආ) විවාහක නම් තමන්ගෙන් යැපෙන ළමයින් ගණන :————.
(ඇ) අවිවාහක නම් තමන්ගෙන් යැපෙන අයගේ විස්තර :————.

4. (අ) තමන්ගේ සහ/හෝ භාර්යාවගේ රක්ෂාව හෝ වෘත්තිය ————.
(ආ) තාවකාලිකද, ස්ථිරද යන බව :————.
(ඇ) මාරුවීම් සහිතද යන බව :————.
(ඈ) දැනට රක්ෂාව කරන ස්ථානය :————.

5. පවුලේ සාමාන්‍ය මාසික ආදායම :————.
(1) පඩිය සහ දීමනා :————.
(2) භාර්යාවගේ/ස්වාමිපුරුෂයාගේ ආදායම :————.

6. කුරුණෑගල වාසය කිරීමට ඇති අවශ්‍යතාවය :————.

7. ඉල්ලුම්කරු හෝ ඔහුගේ/ඇගේ පවුලේ වෙන අයකු සතු ගෙයක් දැනට තිබේද ? එසේ නම් කොහේද යන වග : ————.

8. මාසික කුලිය කෙලින්ම දෙපාර්තමේන්තුවට ගෙවීමට ඉල්ලුම්කරුගේ සේව්‍ය පක්ෂය එකඟද යන බව. (එකඟ බැව් පිළිගැනීමට සේව්‍ය පක්ෂයෙන් ලබාගත් ලිපියක් එවිය යුතුයි.)

ඉල්ලුම්කරුගේ අත්සන :————.

දිනය :————.

## විශේෂ නිවේදනයයි

1959 ජනවාරි 14 වැනි බදාදා ආණ්ඩුවේ නිවාඩු දිනයක් වන බැවින්, 1959 ජනවාරි 16 වැනි දින නිකුත්කරනු ලබන ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා එවන සියළුම දැන්වීම් සහ නිවේදන, 1959 ජනවාරි 12 වැනි සඳුදා පස්වරු 4 ට ප්‍රථම ආණ්ඩුවේ මුද්‍රණාලයට ලැබෙන්ට සැලැස්විය යුතු බව කාගේත් දැනගැනීම සඳහා මෙයින් නිවේදනය කරමි.

1958 දෙසැම්බර් 27 වැනි දින,
ආණ්ඩුවේ මුද්‍රණාලය,
කොළඹ.

බර්නාඩ් ද සිල්වා,
ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති.

ලංකාණ්ඩුවේ මුද්‍රණාලයයේ මුද්‍රණය කරන ලදී